ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்
**Sri Lanka Broadcasting Corporation**

# වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය 2015
# ஆண்டறிக்கை மற்றும் கணக்குக் கூற்று 2015
# Annual Report & Statement of Accounts From 2015



# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

# වාර්ෂික වාර්තාව

## සහ

# ගිණුම් ප්‍රකාශනය

**2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා**

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
කොළඹ.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1. 2015 ජනවාරි මස 01 වන දින සිට 2015 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඉටුකළ කාර්යයන් පිළිබඳ පාලන වාර්තාව
2. 2015 ජනවාරි මස 01 දින සිට 2015 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ගිණුම් වර්ෂය සඳහා ගිණුම් සම්බන්ධ වාර්තාව
3. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවසන් ගිණුම් සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව
4. 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කළ පරිකථනය

මෙයට - විශ්වාසී,

සභාපති,
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
කොළඹ 07.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | පාලන වාර්තාව | 09 |
| 2. | මූල්‍ය ප්‍රකාශනය | 23 |
| 3. | විගණකාධිපති වාර්තාව | 55 |
| 4. | 2015 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය | 81 |

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

## දැක්ම

ප්‍රමුඛ ශ්‍රී ලාංකික ගුවන්විදුලි සන්නිවේදකයා වීම.

## මෙහෙවර

ශ්‍රාවකයාගේ ජීවිතයට බලපාන ආර්ථික, සමාජීය, සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාපනික, විනෝදාත්මක යනාදී විවිධ ක්ෂේත්‍ර ඇසුරෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමෙන් ඔවුනගේ ජීවිත ආලෝකමත් කිරීමක් උදෙසා දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනයට සමත්වන ආකාරයෙන් ගුවන්විදුලි මාධ්‍ය මෙහෙයවීම.

## අරමුණු

1. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුන සඳහා ශ්‍රාවක පිරිසක් සහිත ගුවන්විදුලි නාලිකා පවත්වාගෙන යන ආයතනය ලෙස කටයුතු කිරීම.
2. වගකීමෙන් යුතුව සමබර තොරතුරු කඩිනමින් ලබාදෙන, ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීම.
3. දේශීය සංස්කෘතියේ අභිවෘද්ධිය පිණිස උසස් සහ නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම.
4. දැනුම, ආකල්ප සහ කුසලතාවන්ගෙන් පිරිපුන් ස්වයං අභිප්‍රේරණ කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීම.
5. නිෂ්පාදන සහ විකාශන තාක්ෂණය නිසි පරිදි යාවත්කාලීන කරමින් දෙස් විදෙස් ශ්‍රාවකයන්ට පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම.
6. ආචාරධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන්විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම උදෙසා පුරෝගාමී ආයතනය ලෙස ක්‍රියා කිරීම.
7. ජාතික ගුවන්විදුලිය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා නිර්මාණශීලි දායකත්වය සැපයීම.
8. යහපත් මූල්‍ය පාලනයක් හා මානව සම්පත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම.
9. තරගකාරී වෙළෙඳ පොළ උපායශීලීව ජය ගැනීම.

# පාලන වාර්තාව - 2015

# පාලන වාර්තාව - 2015

## හැඳින්වීම

1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 1967 ජනවාරි මස 05 වන දින සිට ක්‍රියාත්මකවන ලෙසට ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දකි.

2015 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා වූ මාස 12ක කාලපරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණය වේ.

සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේදය තුළ (2015 ජනවාරි 08 දින සිට) පහත දැක්වෙන සාමාජිකයන් සංස්ථා මණ්ඩලයට ඇතුළත් වූහ.

| | | | |
|---|---|---|---|
| 1. | නීතීඥ නන්ද මුරුත්තෙට්ටුවෙගම මහතා | - | සභාපති |
| 2. | එස්.ඒ.සී.කුලතිලක මිය | - | භාණ්ඩාගාර නියෝජිත |
| 3. | ආචාර්ය අරුන්දතී රෙංගනාදන් මිය | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 4. | කිත්සිරි සමරසිංහ මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 5. | ඩබ්.ජයසිරි මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 6. | විශාරද දීපිකා ප්‍රියදර්ශනී පීරිස් මෙනවිය | - | සංස්ථා මණ්ඩල සාමාජික |

## පාලන වාර්තාව

2015 වර්ෂයේ ද ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමී මාධ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. දේශීය නාලිකා මෙන්ම විදේශීය නාලිකා මගින් එම අරමුණ ඉටු කර ගැනීම සඳහා සංස්ථාව කටයුතු කර ඇත. ජනතා මාධ්‍ය ආයතනයක් ලෙස ජනතාවට සිය කාර්යභාරය නොපිරිහෙලා ඉටු කරමින් දැනුම, අවබෝධය මෙන්ම රසවින්දනය ඉහළ නැංවීම සඳහා ජාතික වශයෙන් පුරෝගාමී මෙහෙවරක යෙදුණු වර්ෂයක් ලෙස 2015 වර්ෂය හැඳින්විය හැක. පෙරදිග ප්‍රථම ගුවන්විදුලිය වශයෙන් ආරම්භ වන ජාතික ගුවන්විදුලියට 2015 වර්ෂයේදී 90 වන වර්ෂය පූර්ණය විය.

2015 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සේවාවන් හා ඒවායේ ප්‍රචාරයට යෙදූ වැඩසටහන් සම්බන්ධයෙන් ලුහුඬු සටහන් පහතින් සඳහන් කර ඇත.

## ස්වදේශීය සේවය.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රමුඛතම ජාතික නාලිකාව වන්නේ ස්වදේශීය සේවයයි. පෙර වසරවල සේම 2015 වසරේද ස්වදේශීය සේවය සිය අනන්‍යතාවය රැකගනිමින් විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ශ්‍රාවක ජීවිතයට බලපාන ආර්ථික, සාමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික හා රසවින්දනාත්මක වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

ගුණගරුක යහපත් ජන සමාජයක් ගොඩනැංවීම අරමුණු කරගනිමින් සර්ව ආගමික වැඩසටහන්, ධර්මදේශනා, ධම්ම චින්තා, ධර්ම සාකච්ඡා, කිතුරස වින්දන, ක්‍රිස්තියානි අඩපැය, සිනගෝගය, ඉල්මුල් ඉස්ලාම් ආදී ආගමික වැඩසටහන් ඉදිරිපත් කර ඇත.

ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු පිළිබඳව ශ්‍රාවකයා දැනුවත් කිරීම හා වත්මන් දේශපාලන, සමාජීය, සංස්කෘතික කාරණා සම්බන්ධයෙන් ශ්‍රාවක දැනුම පුළුල් කිරීම සඳහා සුභාරතී, පුවත් අටුවාව, ප්‍රවෘත්ති පසුබිම යන වැඩසටහන් ප්‍රචාරයට යොදන ලදී.

ස්වදේශීය සේවය මගින් කාන්තාවන්ගේ දැනුම, අවබෝධය පුළුල් කිරීම සහ ඇයගේ ජීවන තත්ත්වය නගා සිටුවාලීම උදෙසා සඳුදා සිට සිකුරාදා දක්වා සතියේ දිනයන්හි පෙරවරු 10.00 සිට 11.00 දක්වා ගුවන්කාලය වෙන් කර ඇති අතර ඒ ඔස්සේ කාන්තාවට වැදගත් වන විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ විවිධ මාතෘකා පිළිබඳ සාකච්ඡාමය වැඩසටහන් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි පළපුරුදු විශේෂඥ දැනුමැති සම්පත්දායකයන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කර ඇත. උදාහරණ ලෙස 'ඉසිරවර අසපුව' , 'සුවසෙත', 'සඳමිණ', 'හෙළපියුම', 'නැණ සරණ' ආදී වැඩසටහන් දැක්විය හැකිය.

කෘෂිකාර්මික දැනුම ලබාදීම හා එහි හරවත් සංවර්ධනය සඳහා 'ගෙවත්ත', 'සාර භූමි' වැඩසටහන් ද සන්ධ්‍යා සේවය මගින් කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ ඍජුවම තොරතුරු ඉදිරිපත් කිරීම් ද 2015 වසරේ සිදුකර ඇත.

යහපත්, ගුණගරුක, නැණවත් දරු පරපුරක් බිහි කිරීම සිය ජාතික වගකීමක් ලෙස සලකන ගුවන්විදුලි සංස්ථාව ළමා ශ්‍රාවක ප්‍රතිචාර අතීතයේ සිට මේ දක්වා ඒකාකාරීව රඳවා ගැනීමට හැකි සියලුම ප්‍රයත්න දරා ඇති අතර එහි ප්‍රතිඵල 2015 වසරේ ද උපරිමයෙන් භුක්ති විඳ ඇත. ළමා පරපුර උදෙසා හරවත් ගුණාත්මක වැඩසටහන් ලෙස 'රටක මහිම', 'ගුවනින් නුවණට', 'විදුල ළමා ලෝකය', 'බෝසත් ළමා ළපටියෝ', 'කිතුණු ළමා හමුව', 'සමනල ලන්ද', 'ගුවන් තක්සලාව', 'මේ අපේ පාසලයි' ආදී වැඩසටහන් රාශියක් තිළිණ කර ඇත.

ශ්‍රාවක ප්‍රජාවගේ රසවින්දනය සඳහා විචිත්‍රවත් වැඩසටහන් රාශියක් ඉදිරිපත් කර ඇති අතර 'ගුවන්විදුලි රඟ මඩල', 'මහාවංශය' වැනි නාට්‍ය ද 'පන්සිළුගේ හෝරාව', 'නූර්ති ගී', 'නාඩගම් ගී', 'සේවක සංග්‍රහය', 'ලලිත කළාලේ' ආදී සංගීත වැඩසටහන් ද සඳහන් කළ හැකිය.

ගුණාත්මක සන්නිවේදනයේ ගුවන්විදුලි ගෞරවය රැකගනිමින් ගෞරවාන්විත ශ්‍රාවක ප්‍රජාවක් උදෙසා ප්‍රශස්ත මට්ටමේ වැඩසටහන් ඉදිරිපත් කිරීම ශ්‍රී ලාංකීය ගුවන්විදුලි වංශකථාව ආරම්භයේ සිට සේම 2015 වසරේද ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා ස්වදේශීය සේවය සාඩම්බරයෙන් ඉටුකර ඇත.

## අධ්‍යාපන සේවය

පෙර වර්ෂයන්හි සේම 2015 වර්ෂයේදී ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලැබූ ජාතික මට්ටමේ තරග විභාග සඳහා උපකාරක වැඩසටහන් මාලාවක් ප්‍රචාරය කෙරිණි. කාලීනව පැවැත්වෙන විභාග ඉලක්ක කරගනිමින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) හා (උ.පෙ.) විෂයන් කීපයක් ගෙන ඒ ඒ විෂයයන් සම්බන්ධයෙන් විශේෂ නිපුණතාවයක් ඇති ගුරු මහත්ම මහත්මීන් සහ අවශ්‍ය පරිදි කථිකාචාර්යවරු, මහාචාර්යවරු සම්බන්ධ කරගනිමින් විෂය බද්ධ කරුණු හා විෂයන්ට අදාළව පාසල් දරුවන්ට පැණ නගින ගැටලු, ඉලක්ක ප්‍රශ්නපත්‍ර හා විෂය කරුණු සාකච්ඡාවට ගනු ලැබිණි.

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ / උසස් පෙළ) හා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය යන ප්‍රසිද්ධ පාසල් විභාගවලට පෙර විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වයෙන් පොදු විභාග ගැටලු සාකච්ඡා කරන සජීවී දුරකතන සංවාද වැඩසටහන් පෙර වර්ෂයන්හි මෙන්ම 2015 වර්ෂයේද ප්‍රචාරය කර ඇත.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා දරුවන් හුරු කිරීමට විශේෂ වැඩසටහන් ප්‍රචාරය කර ඇති අතර ඊට අමතරව විභාගයට පෙර විශේෂ සම්මන්ත්‍රණයක් පාසල් ළමුන් හමුවේ පැවැත්වීම සිදුවිය. ඒ සඳහා "දිනමිණ" පුවත්පත ද සම්බන්ධ කර ගනු ලැබිණි.

එම විධිමත් අධ්‍යාපනික වැඩසටහන්වලට අමතරව "සාහිත්‍යයෙන් ජීවිතය රස විඳිමු, ශිල්ප මඩුළුයට, දෙමළෙන් කතා කරමු" ආදී නොවිධිමත් අධ්‍යාපනික වැඩසටහන් ද දරුවන් හා වැඩිහිටියන් වෙනුවෙන් ඉදිරිපත් කර ඇත.

## වෙළෙඳ සේවය

වෙළෙඳ සේවයේ පෙර පැවති තත්ත්වය තවදුරටත් වැඩිදියුණු කරමින් 2015 වර්ෂයේ තවත් පියවරක් ඉදිරියට තබමින්, ශ්‍රාවක ප්‍රජාවගේ අධ්‍යාපනික, දේශපාලනික, ඓතිහාසික දැනුම ප්‍රවර්ධනය කිරීම උදෙසා විවිධ වැඩසටහන් මෙහෙයවමින් කටයුතු කර ඇත.

ඒ උදෙසා 2015 වර්ෂයේ ආරම්භ කරන ලද 'සාරප්‍රභාගිර' 'රේඩියෝ කොළම' 'වකුගඩු රෝග නිවාරණ වැඩසටහන්' 'මතින් නිදහස් රටක්' වැනි වැඩසටහන් හැඳින්විය හැක.

## සිටි එෆ්.එම් සේවය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ නාලිකා අතරින් හරවත් තාරුණ්‍යයක් ගොඩනැගීම අරමුණ කරගනිමින් පැය 24 පුරා වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇති එකම නාලිකාව සිටි එෆ්.එම් සේවයයි.

2015 වර්ෂයේ ද පසුගිය වර්ෂයන්හි මෙන්ම තාරුණ්‍යයට ආමන්ත්‍රණය කරමින් සිටි එෆ් එම් සේවයේ සියලු වැඩසටහන් පෙළගැස්වා ඇත. මැදපෙරදිග සේවයේ නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ නෑදෑ හිතමිතුරන් සම්බන්ධ කරගනිමින් වසර ගණනාවක සිට විකාශයට යොදා ඇති 'මැදපෙරදිග සේවය' 2015 වර්ෂයේ සතියේ දින පහ තුළම ප්‍රචාරය කර ඇත.

කුඩා දරුවන්ගේ දැනුම වර්ධනය, යහපත් සෞඛ්‍ය පුරුදු ඇති කිරීම, ගුණගරුක දරු පරපුරක් බිහි කිරීම උදෙසා 'මල් සමනල්ලු' නමින් වැඩසටහනක් සිටි එෆ්.එම් සේවය ඔස්සේ විකාශය විය. කාලීන වශයෙන් ජනතාව මුහුණදෙන විවිධ ගැටලු හා විවිධ සිදුවීම් සම්බන්ධයෙන් විමර්ශනාත්මක වැඩසටහනක් වශයෙන් නිෂ්පාදනය කර ඇති 'සීතල ඊතල' සෘජුවම අසන්නන් හා සම්බන්ධවෙමින් ප්‍රචාරය වූ වැඩසටහනකි. දිනපතා පුවත්පත්වල ඇති ප්‍රවෘත්ති, විශේෂාංග පිළිබඳව විමර්ශනාත්මක හා නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් වශයෙන් 'පත්තරේ විස්තරේ' ප්‍රචාරය වූ අතර 2015 වර්ෂය පුරා ජනතාවගේ විශේෂ ප්‍රතිචාර හා ඇගයීම් උපයාගත් වැඩසටහනක් වශයෙන් හැඳින්විය හැකිය. 'හැඩකාර වසන්ත' 'සතුටු දිගන්තය' 'හිතමිතුරු සුළඟ' ගී රසවින්දනාත්මක වැඩසටහන් වශයෙන් ප්‍රචාරය කෙරිණි. අතීත සිදුවීම් හා විශේෂ අවස්ථා පිළිබඳව තොරතුරු ඇතුළත් කර, දවසේ විශේෂත්වයත් සමඟින් 'අතීතයෙන් දවසක්' වැඩසටහන ප්‍රචාරය කෙරිණි.

සතිපතා විකාශය වන "අකුණ" වැඩසටහන සතියක් තුළ සිදුවන දේශපාලනික සිදුවීම් පිළිබඳව විමර්ශනාත්මක දෘෂ්ටියකින් යුතුව ප්‍රචාරය කළ වැඩසටහනක් වන අතර දේශපාලන ක්ෂේත්‍රය හා බැඳුනු විශේෂ සිදුවීම් සම්බන්ධයෙන් විමසිලිමත් විශේෂ ශ්‍රාවක පිරිසක් ඒ වටා එක්වී ඇත.

අතීතයේ සිටම සුභාවිත ගීතය ජනගත කිරීමේ අරමුණ ඇතිව ප්‍රචාරය වන "ආරාධනා ස්වර දැහැන" විශේෂ රසික ප්‍රතිචාර මධ්‍යයේ 2015 වර්ෂය තුළ දී ද ප්‍රචාරය විය.

නව නිර්මාණකරුවන් හඳුන්වා දීම හා ඔවුන් දිරි ගැන්වීමත්, නව නිර්මාණ ශ්‍රාවකයින් අතරට ගෙනයාමත් ඉලක්ක කරගනිමින් සතියේ දිනයන්හි සෑම පැයකට වරක්ම නව ගීතයක් ප්‍රචාරයට යොදා ඇත. එහිදී සිටි එෆ්.එම් සඳහා ලැබෙන නව ගී නිර්මාණ විශාල සංඛ්‍යාවක් අතරින් ප්‍රචාරයට සුදුසු යැයි නිර්දේශිත ගීත පමණක් ප්‍රචාරයට කටයුතු කර ඇත.

ඊට අමතරව ජාතික වශයෙන් වැදගත් සියලුම විශේෂ අවස්ථා සහ ආගමික උත්සව ආදිය ඒ ඒ කාලයන්හි විශේෂ වැඩසටහන් ඔස්සේ ශ්‍රාවක ප්‍රජාව වෙත ගෙනයාමට සිටි එෆ්.එම් සේවය 2015 වර්ෂයේද කටයුතු කර ඇත.

තරුණ ප්‍රජාව ඉලක්ක කරගත්ත ද ගුණාත්මක ගී හා වැඩසටහන් පමණක් ඉදිරිපත් කරමින්, හැකි සෑම අවස්ථාවකම පැහැදිලි, නිවැරදි භාෂාවක් භාවිත කිරීමට වගබලා ගන්නා සිටි එෆ්.එම් සේවය ආනන්දයෙන් ප්‍රඥාව කරා සිය රසික ප්‍රජාව කැඳවාගෙන යාම සඳහා වූ සිය වගකීම 2015 වර්ෂයේ දී නිසි අයුරින් ඉටු කර ඇත.

## දෙමළ ස්වදේශීය සේවය

දෙමළ භාෂාව කතා කරන ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් ආරක්ෂා කර ගනිමින් පොදුවේ ශ්‍රාවක ජීවිතයට බලපාන සමාජීය, ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික හා රසවින්දනාත්මක වැඩසටහන් ප්‍රචාරය කිරීම පෙර වර්ෂවල සේම 2015 වර්ෂයේ ද දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ සිදුකර ඇත.

දෙමළ ජනතාවගේ සංස්කෘතික උත්සව වන තෛපොංගල් දින වැඩසටහන්, සරස්වතී පූජා වැනි වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත. දෙමළ භාෂාව කතා කරන ජනතාව හින්දු සහ ක්‍රිස්තියානි / කතෝලික ආගම් ඇදහීම සිදුකරන අතර, ශ්‍රාවක ප්‍රජාවගේ අවශ්‍යතාවයන් අනුව විවිධ ආගමික උත්සව කාලවකවානු අළලා විශේෂ වැඩසටහන් දියත් කර ඇත. ඒ සඳහා උදාහරණ ලෙස 2015 වර්ෂය තුළ

ප්‍රචාරය කරන ලද 'යාවයි තිරකදර්ශනම්' බයිබල් වැඩසටහන ද 'දීපම්' ක්‍රිස්තියානි ආගමික වැඩසටහන ද විශේෂයෙන් හඳුන්වාදිය හැකිය. වෙසක් උත්සවය හා පොසොන් උත්සවය නිමිති කොට ජාතික උත්සව අවස්ථා ප්‍රචාරයට යොදා ඇත. හජ්ජි උත්සවය සම්බන්ධයෙන් වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

ජාත්‍යන්තර වශයෙන්, ජාතික වශයෙන් හා සමාජීය වශයෙන් වැදගත්වන විවිධ දින මූලික කරගනිමින් විශේෂ වැඩසටහන් ප්‍රචාරයට යෙදීම සහ ඒවා සම්බන්ධයෙන් පැවති ජාතික උත්සව ආවරණය කිරීම 2015 වසරේද සිදු කර ඇත. ඒ සඳහා උදාහරණ ලෙස, 'රටවටා අවුරුදු' සිංහල හින්දු අලුත් අවුරුදු වැඩසටහන, නිදහස් දින සැමරුම, මැයි දින සැමරුම, මත්ද්‍රව්‍ය නිවාරණ දින වැඩසටහන, ලෝක ළමා දින වැඩසටහන, කාන්තා දින වැඩසටහන දැක්විය හැක.

## තෙන්ඩ්‍රල් සේවය

විශේෂයෙන් දෙමළ අසන්නන්ගේ විනෝදාස්වාදය මූලික කරගනිමින් වැඩසටහන් ප්‍රචාරය කිරීම තෙන්ඩ්‍රල් සේවයේ අරමුණ වන අතර එහි ඉලක්කගත ශ්‍රාවකයා වන්නේ දෙමළ භාෂාව කතා කරන තරුණ පරපුරයි. වර්ෂය පුරා පැවති විශේෂ ජාතික, ආගමික, සමාජීය වැදගත්කම් සහිත දිනයන්හි විශේෂ වැඩසටහන් ප්‍රචාරය කිරීම 2015 වර්ෂයේද සිදු කර ඇත. ඒ අනුව තෛපොංගල් දිනය හා සරසවතී පූජාව සඳහා විශේෂත්වයක් ලබා දෙමින් වැඩසටහන් ප්‍රචාරය කිරීම සහ සංස්ථා පරිශ්‍රය තුළ සංස්කෘතික උත්සව සංවිධානය කිරීම පෙර වර්ෂවල සේම 2015 වර්ෂයේ ද උත්කර්ෂවත් අන්දමින් සිදුවිය. සිංහල හින්දු අලුත් අවුරුදු දිනය, රාමසාන් උත්සව සමය, හජ්ජි උත්සවය, නිදහස් දිනය, කාන්තා දිනය, ලෝක ළමා දිනය ආදිය සඳහා විශේෂ වැඩසහන් ප්‍රචාරය කර ඇත.

දෙමළ භාෂාව කතා කරන ශ්‍රාවකයාගේ දැනුම විනෝදය මූලික කරගනිමින් ප්‍රචාරය වූ 'පාට්ටක්ක පාට්ට' නමින් අම්බිගා ජුවලර්ස් අනුග්‍රහයෙන් පටිගත කරන ලද ගීතයෙන් ගීතය වැඩසටහන විශේෂ ශ්‍රාවක ප්‍රතිචාර සහිත වැඩසටහනක් වශයෙන් හඳුන්වා දිය හැකිය. 'එමරල්ඩ් කලෙයි කදම්බ' වැඩසටහන, ගීත, නාට්‍ය, විකට ජවනිකා වැනි විවිධ විචිත්‍රාංගයන් ඇතුළත් දැනුම, විනෝදය සපිරි ඉතා ජනප්‍රිය වැඩසටහනකි. දිවයින පුරා විසිරි සිටින දක්ෂ සංගීත කණ්ඩායම් සඳහා අවස්ථාව සලසා දීමේ අරමුණින් දියත් කෙරෙන 'පොන්මාලෙයි පොලුදු' වැඩසටහන ද මසකට එක් වැඩසටහනක් වශයෙන් 2015 වර්ෂය පුරා ප්‍රචාරය වූ වැඩසටහනකි.

පාසල් දරුදැරියන්ගේ විදුලිය පිළිබඳ දැනුම උරගා බලන 'අරිවොලි' ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන විදුලිබල මණ්ඩලයේ අනුග්‍රහයෙන් 2015 වර්ෂය පුරා ප්‍රචාරය වූ වැඩසටහනකි.

නල්ලූර් පූජා සමය අරඹයා ඒ හා සම්බන්ධ වැඩසටහන් සහ තත්ත්ව විස්තර වාර්තා ලබාදීම සිදුවිය.

ක්‍රිස්තියානි ආගමික වැදගත්කමකින් යුතු තලවිල හා මඩු දේවස්ථාන වන්දනා සමයන්හි විශේෂ වැඩටසහන් සහ තත්ත්ව විස්තර වාර්තා ලබාදීම සිදුකරනු ලැබිණි. එසේම ක්‍රිස්තියානි / කතෝලික ආගමික වැඩසටහන් රාශියක් සේවාදායක අනුග්‍රහය යටතේ තෙන්ඩ්‍රල් සේවය ඔස්සේ ප්‍රචාරයට යොදා ඇත.

## මුස්ලිම් සේවය

වසර 65ක් පුරා ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව මෙන්ම දකුණු ඉන්දියාවේ මුස්ලිම් ජනතාවට ද විශාල සේවයක් සලසන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මුස්ලිම් සේවය, 2015 වසරේ ද මුස්ලිම් ජනතාව වෙනුවෙන් ආගම මෙන්ම සංස්කෘතිය පෝෂණය කිරීම උදෙසා විවිධ වැඩසටහන් නිෂ්පාදනය කර ඇත.

ළමා සහ කාන්තා සඟරාමය වැඩසටහන්, සංගීත සහ නාට්‍යමය වැඩසටහන්, තාරුණ්‍යයට අදාළ වැඩසටහන්, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ආදිය ද සාර්ථකව නිෂ්පාදනය කොට ප්‍රචාරයට යොදන ලදී.

මැලේ සහ උර්දු භාෂා කතා කරන අසන්නන් වෙනුවෙන් සඟරාමය වැඩසටහන් ද ප්‍රචාරය වන අතර 80%ක්ම අනුග්‍රාහක වැඩසටහන් වේ.

## ඉංග්‍රීසි සේවය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ආරම්භයේ සිට අද දක්වා ඉහළ රසික ප්‍රසාදයක් සමගින් ක්‍රියාත්මකවන ඉංග්‍රීසි සේවය සතුව පැරණි ගීත, නාට්‍ය ආදී විවිධ වැඩසටහන් රාශියක එකතුවක් පවතී. ඉංග්‍රීසි සේවය වටා එක්වී සිටින ශ්‍රාවක ප්‍රජාවගේ වැඩි නැඹුරුවක් පවතින්නේ ගුවන්විදුලි සංස්ථාව සතුව පවතින පැරණි රසාංගවලට වන අතර වැඩසටහන් පෙළගැස්මේ දී රසික රසඥතාවය ඉහළ දැමීමේ අරමුණින් විශේෂ සැලකිල්ලක් දක්වන්නේ ද එම වැඩසටහන් සඳහා වේ. පෙර වර්ෂයන්හි මෙන්ම 2015 වර්ෂයේ ද පැරණි ගීත හා වැඩසටහන්වලට අමතරව ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු ඇතුළත් වැඩසටහන්, කාන්තා වැඩසටහන්, ළමා වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇති අතර ජාතික හා ආගමික වශයෙන් වැදගත්වන විශේෂ උත්සව අළලා විශේෂ වැඩසටහන් ප්‍රචාරය කර ඇත. ඒ අතර පාප්වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය විශේෂයෙන් සැලකිය හැකිය. කාලීන වශයෙන් වැදගත් වන මාතෘකා ඔස්සේ අදාළ විෂයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රාගුණ්‍යයක් සහිත සම්පත්දායකයන් සම්බන්ධ කරගනිමින් කාලීන වැඩසටහන් නිෂ්පාදනය කර ඇත. ජාත්‍යන්තර දිනයන්ගේ විශේෂයත්වයන් මතුකරමින් ඒවායේ ඇති වැදගත්කම හා විශේෂ තොරතුරු ඇතුළත් වැඩසටහන් ප්‍රචාරය කරන ලදී. අන්තර්ජාතික සම්බන්ධතා පුළුල් කරගැනීමේ ජාතික අවශ්‍යතාවයට උරදීමක් වශයෙන් තානාපතිවරු හා තානාපති කාර්යාල නිලධාරීන් සම්බන්ධ කරමින් විවිධ රාජ්‍යන්ගේ විශේෂ දිනයන් හා අවස්ථාවන් ඉලක්ක කර ගනිමින් නිෂ්පාදිත වැඩසටහන් ප්‍රචාරය කර ඇත.

## රජරට සේවය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රථම ප්‍රාදේශීය සේවාව වශයෙන් 1979 වර්ෂයේ ආරම්භ කරන ලද රජරට සේවය තම ප්‍රාදේශීය අසන්නන් වෙනුවෙන් හරවත්, රසවත් වැඩසටහන් ඉදිරිපත් කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. 2015 වර්ෂයේ ද තම අභිමතාර්ථ සාධනය සඳහා දේශපාලනික, සමාජීය, සංස්කෘතික, ආගමික වශයෙන් වැදගත් වැඩසටහන් රාශියක් ඉදිරිපත් කර ඇත. 2015 වර්ෂය ආරම්භය සැමරීම සඳහා රජරට සේවයෙන් බිහිවූ කලාකරුවන් ගෙන්වා විශේෂ වැඩසටහනක්, පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් රසවින්දන වැඩසටහන්, අධ්‍යාපනික වැඩසටහන් සහ අනුරාධපුර අනගාරික ධර්මපාල මධ්‍යස්ථානය වාර්ෂිකව සංවිධානය කරන පෙරහැර විස්තර වැඩටසහනක් ද ප්‍රචාරය කර ඇත. වකුගඩු රෝග නිවාරණ වැඩසටහන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සමග ඒකාබද්ධව සාර්ථකව ප්‍රචාරය කෙරිණි.

## කඳුරට සේවය

කඳුරට සේවයේ අසන්නන් වෙනුවෙන් 2015 වර්ෂයේ දැනුම, සතුට, අවබෝධය තුළින් වින්දනය ලබාදීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

පෙරවරු 05.25ට ආරම්භවන ආගමික වැඩසටහන් සමඟ දවස ආරම්භ වී 'කාලීන ප්‍රවෘත්ති', 'කඳුරට පුවත්', 'සුවදිසි අරුණ', 'වෛද්‍යවරයෙක් කතා කරයි', ආදී බටහිර වෛද්‍ය වැඩසටහන් ද 'වෙද මැඳුර'

ආදී ආයුර්වේද වැඩසටහන් ද 'පසන් මැඳුර' ආදී කාන්තාවන්ගේ දැනුම වර්ධනය කරන කාන්තා වැඩසටහන් ද 'අස්වැන්න', 'රස ජනනී', 'කෘෂි චාරිකා', 'කහවනු තුරු' වැනි කෘෂිකර්මාන්තයට අදාල වෙළෙඳ වැඩසටහන් ද 'සක්විති මළුව', 'ධර්ම දේශනා' ආදී බෞද්ධ වැඩසටහන් ද 'සරළ ගී', 'මියැසි රසාංග', 'නොමියෙන ගී', 'තාරුණ්‍යයේ රිද්මය', 'කලා කලස', 'ඔබ වෙනුවෙන් හද රැඳි ගී', 'කෝමල රේඛා', 'සැදෑ මිහිර', 'ස්වර්ණ සත්සර දැහැන' ආදී විවිධ රසවින්දනාත්මක මෙන්ම තාරුණ්‍යයට අදාළ වැඩසටහන් ද ශ්‍රාවක දැනුම, ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රචාරය වන 'අසන්නන් සමඟ' වැනි වැඩසටහන් ද දෙමළ, මුස්ලිම් වැඩසටහන් ද සාර්ථකව නිෂ්පාදනය කර ප්‍රචාරයට යොදා ශ්‍රාවක ප්‍රතිචාර ලබා ඇත.

## රුහුණු සේවය

රුහුණු සේවය මඟින් 2015 වසරේ ගොවි ජනතාව දැනුවත් කිරීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව කෘෂිකාර්මික වැඩසටහන් සාර්ථක ලෙස ඉදිරිපත් කොට ඇත.

ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් ලෙස පවත්වා ගැනීමට අදාළව බටහිර වෛද්‍ය සාකච්ඡා වැඩසටහන් ඊට අදාළ සම්පත්දායකයන් ද සමඟ නිෂ්පාදනය කොට ඇත.

ශ්‍රාවකයන්හට ආගමික පරිසරය සකසා දීමේ අරමුණින් දිනපතා පිරිත් දේශනා මෙන්ම වෙසක් සතිය තුළ විශේෂ වෙසක් ධර්ම දේශනා මාලාවක් ද, කඨින චීවර මාසය තුළ ධර්ම දේශනා 40ක් පමණ ද ප්‍රචාරය කර ඇත. මීට අමතරව ප්‍රදේශයේ විශේෂ ආගමික ස්ථානවලට සම්බන්ධ පෙරහැර මංගල්‍යයන් පිළිබඳව ද වැඩසටහන් ප්‍රචාරය කර ඇත.

එසේම සිංහල හින්දු අලුත් අවුරුදු වැඩසටහන්, පාසල් ක්‍රිකට් තරඟාවලි, පැයේ ගීතය, ජාතික තරුණ සේවා සභාවේ යොවුන් හඬ ආදී විවිධ විශේෂ වැඩසටහන් ශ්‍රාවකයින්ගේ දැනුම, රසවින්දනය නංවාලීමේ අරමුණින් ප්‍රචාරය කොට ඇත.

## වයඹ හඬ

2015 වසරේ වයඹ පළාත් පාලන ආයතනවල සංවර්ධන සැලැස්ම පිළිබඳව ශ්‍රාවකයා දැනුවත් කිරීමේ වැඩසටහන්, උතුරේ සංවර්ධනය, කෑගල්ල දිස්ත්‍රික් සංවර්ධනය අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතා විසින් කුරුණෑගලදී ඇරඹූ නිවාස 50,000 වැඩසටහන ආදී විවිධ සංවර්ධන වැඩසටහන් ප්‍රචාරය කර ඇත. එසේම ආගමික, සාහිත්‍ය රසාස්වාදනය, කෘෂිකාර්මික, ගී රස වින්දන සහ නව සොයාගැනීම් පිළිබඳ වැඩසටහන් ද ශ්‍රාවකයා වෙනුවෙන් ඉදිරිපත් කර ඇත.

## රේඩියෝ දඹාන

රේඩියෝ දඹාන ගුවන්විදුලි නාලිකාව, ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව ඉලක්ක කරගනිමින් සහ දඹාන ආශ්‍රිත ප්‍රජාවගේ අවශ්‍යතා සඳහා ක්‍රියාත්මකවන වෙළඳ අභිප්‍රායෙන් මිදුණු එකම ගුවන්විදුලි නාලිකාව වේ. ජාතික අවශ්‍යතාවයක් සේ සලකා, ආදිවාසීන්ගේ අනන්‍යතාව, ඇදහිලි හා විශ්වාස, කලාකෘති ආදිය සංරක්ෂණය කරමින් ඔවුන්ගේ ජනජීවිතයට වැදගත්වන තොරතුරු ඉදිරිපත් කිරීම රේඩියෝ දඹාන විසින් 2015 වර්ෂයේ ද මැනවින් සිදුකර ඇත.

ඒ යටතේ පහත සඳහන් වැඩසටහන් විශේෂයෙන් උපුටා දැක්විය හැකිය.

- ශ්‍රී ලංකාවේ ඉපැරණිම ජනකොටසක් වන වැදි ජනතාවගේ සංස්කෘතිය, භාෂාව තහවුරුකොට පවත්වාගෙන යාම මූලික අරමුණ කරගනිමින් 'වන්නියලැත්තන්ගේ භාෂාවෙන් කතා කරමු' වැඩසටහන ප්‍රචාරය කිරීම

- වස විස නැති ගොවිතැන සඳහා ජනතාව යොමු කිරීමේ අරමුණින් වී හා අනෙකුත් ගොවිතැන් සඳහා කාබනික ද්‍රව්‍ය යෙදීමේ වැදගත්කම පිළිබඳ විශේෂ වැඩසටහන් ප්‍රචාරය කිරීම

- මහවැලි කලාපවල ශීඝ්‍රයෙන් පැතිරෙන වකුගඩු රෝගය පිළිබඳ ශ්‍රාවකයා දැනුවත් කිරීමේ විශේෂ ව්‍යාපෘතිය

  මේ සඳහා සම්පත්දායකයන් ලෙස වකුගඩු රෝගය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරු, මහනුවර මහ රෝහලේ වෛද්‍යවරු හා ගිරාඳුරුකෝට්ටේ වකුගඩු රෝග ඒකකය සම්බන්ධ කරගනිමින් වැඩසටහන් ප්‍රචාරයට කටයුතු කර ඇත.

- ඓතිහාසික මහියංගනය රජමහා විහාරයේ පෙරහැර, වැදි පෙරහැර හා මහවැලි ක්‍රීඩා උත්සවයේ මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම.

  මීට අමතරව දඹාන ගම්මානයේ ගුවන්විදුලි වැඩසටහන් ප්‍රචාරය කිරීම සඳහා වැදි සංස්කෘතියට ආවේනික උපාංගයන්ගෙන් සමන්විතව මැදිරියක් ඉදිකිරීම 2015 වර්ෂයේ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැකිය.

## සංගීත අංශය

ගුවන්විදුලි ශ්‍රාවක ජනයාගේ රසවින්දනයත් දැනුමත් සඳහා පහත සඳහන් වැඩසටහන් සාර්ථක ලෙස නිෂ්පාදනය කොට ප්‍රචාරය කර ඇත.

පසුගිය කාලවල කටහඬ පරීක්ෂණයෙන් ශ්‍රේණිගත කරන ලද ශිල්පී ශිල්පිනියන්ගේ 'සරල ගී' වැඩසටහන් 2015 වර්ෂයේදී ප්‍රචාරයට යොදන ලදී. මෙහිදී විශේෂ ශ්‍රේණිය, ඒ ශ්‍රේණිය, බී ශ්‍රේණිය අනුව අදාළ ශිල්පීන්ට වැඩසටහන් ලබාදුන් අතර ඉතා සාර්ථක ගී නිර්මාණ බිහි වූ බව සඳහන් කරමු.

ගීත සාහිත්‍යය තුළ ජනප්‍රිය වී ඇති ගීතවල අනුවාදන සෑම බදාදාවකම රාත්‍රී 7.00 සිට 7.30 දක්වා 'මියුරුසර' නමින් ද, කටහඬ පරීක්ෂණයෙන් සමත් ශිල්පීන් විසින් ගයනු ලැබූ පැරණි නාඩගම් ගී, නූර්ති ගී වැඩසටහන් ද, ශ්‍රාවක රසවින්දනය සපුරාලීම පිණිස ඉදිරිපත් කෙරිණි. සෑම පොහෝ දිනකම 12.00 - 12.45 දක්වා 'ශ්‍රද්ධාංජලී බොදු ගී සරණිය' ද ධම්ම පදය ආශ්‍රයෙන් ලියැවුනු නව ගීත ඇතුළත් 'ධම්ම පද ගී' වැඩසටහන ද සෑම බදාදා දිනකම පස්වරු 5.30 සිට 5.45 දක්වා ස්වදේශීය සේවය ඔස්සේ සාම්ප්‍රදායික ජනගී ඇතුළත් ජන සංගීත වැඩසටහන් ද වෙළෙඳ සේවය ඔස්සේ පස්වරු 3.00 - 4.00 දක්වා ප්‍රචාරය වන 50-60 දශකවල නිර්මාණය වූ ග්‍රැමෆෝන් ගීත හා චිත්‍රපට ගීත ඇතුළත් වැඩසටහන හා සෑම ඉරිදාවකම පස්වරු 1.15 සිට 1.30 දක්වා ප්‍රචාරය වන විරිඳු වැඩසටහන ද 2015 වර්ෂය තුළ සංගීත අංශය මඟින් සාර්ථකව ප්‍රචාරයට යොදා ඇත.

ශ්‍රාවකයින්ගේ දැනුම වර්ධනය උදෙසා උත්තර භාරතීය රාගධාරී සංගීත ශිල්පීන්ගේ ගායන, වාදන ඇතුළත් 'සරස රාවය' විශ්ව සංගීත නිර්මාණ සහ ශිල්පී ජීවන තොරතුරු අතුළත් 'විශ්වයේ වින්දනීය ප්‍රතිරාව', 'ලලිත කළාලය' වැනි වැඩසටහන් ද ඉතා සාර්ථකව ඉදිරිපත් කර ඇත.

රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි සේවය කරන සේවකයන්ගේ කුසලතා එළිදැක්වීම පිණිස 'සේවක සංග්‍රහය' වැඩසටහන එම ආයතන වෙත ගොස්, පටිගත කොට ප්‍රචාරයට යොදා ඇත. දෙමළ වාදක මණ්ඩලයක් සඳහා ශිල්පීන් තෝරා ඇත. පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා කටහඬ පරීක්ෂණයක් පවත්වා ඔවුන් ශ්‍රේණි ගතකොට තෝරාගත් ශිල්පීන්ගේ ගීත ඇතුළත් සංයුක්ත තැටියක් නිෂ්පාදනය කොට ඇති අතර, මසකට තුන්වරක් ප්‍රේක්ෂකයන් ඉදිරියේ වාද්‍ය සංගීතමය වැඩසටහක් ඉදිරිපත් කොට ඇත.

## ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය

2015 වසර තුළ දී ද පෙර වර්ෂයන්හි මෙන්ම ගුවන්විදුලි සංස්ථා ප්‍රවෘත්ති අංශය සිය අනන්‍යතාවය රැකගනිමින්, නිවැරදි හා වගකීම් සහිත විදග්ධ ප්‍රවෘත්ති වාර්තාකරණයක නියැළී ඇත.

2015 ජනවාරි 08 වැනිදා පැවැති ජනාධිපතිවරණය සහ අගෝස්තු 17 වැනිදා පැවති පාර්ලිමේන්තු මැතිවරණය ඉලක්ක කරගනිමින් පැවති ජනහමු, මාධ්‍ය සාකච්ඡා ආදිය ආවරණය කර ඇති අතර ඒ සම්බන්ධ විශේෂ ප්‍රවෘත්ති වාර්තාකරණ කටයුතු 2015 වසර තුළ ප්‍රමුඛ කාර්යයක් සේ සලකා ක්‍රියාත්මක කර ඇත.

2015 ජනවාරි 13 වැනිදා පැවති ශුද්ධොත්තම පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය ඇතුළු 2015 වසර තුළ යෙදුණු විශේෂ අවස්ථාවන් අළලා ප්‍රවෘත්ති සම්පාදනය කර ඇත.

දිනකට ප්‍රවෘත්ති විකාශ 12ක් භාෂාත්‍රයෙන්ම ප්‍රචාරය වී ඇති අතර පැයෙන් පැය පුවත්, රටතොට පුවත්, ළමා පුවත් ආදිය ද කාලීන වැදගත්කමක් ඇති වැඩසටහන් ද ප්‍රචාරය කරමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රවෘත්ති අංශය ශ්‍රාවක ජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් කර ඇත.

## මැදිරි මෙහෙයුම් අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සියලුම වැඩසටහන් පටිගත කිරීම, සංස්කරණ කටයුතු කිරීම, පූර්ව නිවේදන සැකසීම, වෙළෙඳ දැන්වීම් සකස් කිරීම, සම්බන්ධතා මැදිරි හා සජීව විකාශයන් ගෙන ඒම ආදී සියලු ක්‍රියාකාරකම් සඳහා සංස්ථාවේ ඇති සියලුම මැදිරි අවශ්‍ය පරිදි සූදානම් කොට අඛණ්ඩ සේවාවන් පවත්වාගෙන යාම සඳහා දායකත්ව සැපයීම පෙර වර්ෂයන්හී මෙන්ම 2015 වර්ෂයේ ද මැදිරි මෙහෙයුම් අංශය විසින් ලබා දී ඇත.

## අභ්‍යාස හා විදේශ සම්බන්ධතා අංශය

ගුවන්විදුලි සංස්ථා අභ්‍යාස ආයතනය අභ්‍යන්තර හා බාහිර ආයතන සඳහා පවත්වන පුහුණු වැඩමුළු පසුගිය වර්ෂයන් සමග සැසඳීමේදී තරමක පහළ වැටීමක් සිදුවූ වර්ෂයකි 2015 වර්ෂය. නාගරික සංවර්ධන අධිකාරියේ මැදිහත්වීමෙන් සංස්ථා පරිශ්‍රය අලුත්වැඩියා කිරීම හේතුවෙන් අභ්‍යාස ආයතනය සඳහා සුදුසු ස්ථානයක් 2015 වර්ෂය පුරාම නොලැබුණි. එහෙත් අවම පහසුකම් යටතේ හැකි උපරිම ආකාරයෙන් අභ්‍යන්තර පුහුණු වැඩමුළු සංවිධානය කෙරිණි. ඒවා පහතින් දක්වා ඇත.

1. සංස්ථාවේ පාලන අංශයේ කාර්ය මණ්ඩලය සඳහා (මාසික) මූලික පරිගණක පුහුණු වැඩමුළුව
2. අර්ධකාලීන අලෙවි ප්‍රවර්ධන සහයකවරුන් සඳහා එක්දින පුහුණු වැඩමුළුව
3. වැටුප් සැකසීම සම්බන්ධ පරිගණක වැඩසටහන හඳුන්වා දීම, මුදල් හා තොරතුරු තාක්ෂණ අංශය සඳහා තුන්දින වැඩමුළුව
4. සිංහල නිවේදක නිවේදිකාවන් සඳහා සිංහල භාෂා භාවිතය සම්බන්ධ දෙදින වැඩමුළුව
5. දෙමළ නිවේදක නිවේදිකාවන් සඳහා භාෂා භාවිතය සම්බන්ධ එක්දින වැඩමුළුව
6. මුදල් අංශය සඳහා මූලික පරිගණක පුහුණු වැඩමුළුව (මාසික)
7. කොන්ත්‍රාත් නිවේදක නිවේදකාවන් සඳහා භාෂා භාවිතය පිළිබඳ එක්දින වැඩමුළුව
8. කාර්මික නිලධාරීන් සඳහා (නව බඳවා ගැනීම්) පුහුණු වැඩමුළුව

9. ප්‍රාදේශීය වාර්තාකරුවන් 70 දෙනෙකු සඳහා එක්දින වැඩමුළුව

10. ඉහළ හා මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 70 දෙනෙකු සඳහා මූල්‍ය කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව

11. කළමනාකරණ සහකාර (නව බඳවා ගැනීම්) සඳහා පුහුණුව ලබාදීම

ඊට අමතරව බාහිර පුහුණු අවස්ථා කීපයක් සංවිධානය කළ අතර ඒවා පහතින් දක්වා ඇත.

1. 2015.06.01 දින නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවකට ගුවන්විදුලි මාධ්‍ය පිළිබඳව ලබාදුන් පුහුණුව
2. චීන ජාත්‍යන්තර ගුවන්විදුලියේ සිංහල සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරියගේ පුහුණු වැඩමුළුව
3. ජාතික තරුණ සේවා සභාවේ ඉල්ලීමකට අනුව පාසල් දරුවන් සඳහා පැවැත්වූ එක්දින වැඩමුළුව
4. අවුරුදු 9 - 11 පාසල් දරුවන් සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්පය පිළිබඳ පුහුණු පාඨමාලාව
5. ශ්‍රීපාලි විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ ගුවන්විදුලි මාධ්‍ය පුහුණුව පැවැත්වීම

## කැසට් හා ප්‍රකාශන අංශය

2015 වර්ෂය තුළ කැසට් හා ප්‍රකාශන අංශය විසින් පහත සඳහන් නව සංයුක්ත තැටි නිෂ්පාදනය කර අලෙවියට යොදා ඇත.

1. නිල් හීන දූපතේ - ආචාර්ය අජන්තා රණසිංහයන් රචනා ගීත ඇතුළත් සංයුක්ත තැටිය
2. උජුපටිපන්නෝ - පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමිගේ ධර්ම දේශනා ඇතුළත් සංයුක්ත තැටිය
3. මලක් වුනේ - වයලින් වාද්‍ය ශිල්පී කළණි පෙරේරාගේ වාදන ඇතුළත් ගී අනුවාදන සංයුක්ත තැටිය
4. ජෝතිට ලියූ ගී - ආචාර්ය අජන්තා රණසිංහයන් එච්.ආර්.ජෝතිපාල ගායන ශිල්පියාට ලියූ ගීත ඇතුළත් සංයුක්ත තැටිය

මීට අමතරව රේගු මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ව්‍යවසාය ප්‍රදර්ශනය, ෂොපින් ලංකා ප්‍රදර්ශනය, ජා-ඇල කුලසිංහ විද්‍යාලයීය ප්‍රදර්ශනය, කන්ස්ට්‍රක්ෂන් ප්‍රදර්ශනය, ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය ආදී 2015 වර්ෂයේ පැවති විශේෂ අවස්ථාවන්හිදී සහ ගුවන්විදුලි සංස්ථා පරිශ්‍රයේ ඇති කැසට් අලෙවි සලෙන්, දිවයින පුරා විසිරී සිටින අලෙවි නියෝජිතයින් මඟින් ගුවන්විදුලි සංස්ථා කැසට්, සංයුක්ත තැටි හා ප්‍රකාශන අලෙවිය සිදු කර ඇත.

අන්තර්ජාලය ඔස්සේ සමාජ ජාල වෙබ් අඩවි භාවිත කරමින් (Facebook – slbc ගී presentation – like page හරහා) ප්‍රචාරණ කටයුතු ආරම්භ කළ අතර slbcgeepresentation@gmail.com නමින් විද්‍යුත් ලිපිනයක් ආරම්භ කිරීම 2015 වර්ෂයේ සිදුවූ විශේෂ කටයුතු ලෙස හඳුන්වා දිය හැකිය. සංයුක්ත තැටි හා ප්‍රකාශන සම්බන්ධ විස්තර ඇතුළත් අත්පත්‍රිකා සහ බහාලන කවර මුද්‍රණය කොට බෙදා හැරීම ද මෙම වර්ෂයේදී සිදුවිය.

## ශ්‍රවණ පර්යේෂණ අංශය

1. උතුරු සහ වයඹ පළාත්වල මධ්‍යම තරංග සහිත ගුවන්විදුලි යන්ත්‍ර සංඛ්‍යාව සහ මධ්‍යම තරංග ඔස්සේ සවන්දෙන සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනයක් සිදු කරනු ලැබිණ. එමගින් පහත සඳහන් කරුණු අනාවරණය විය.

1.1 උතුර සහ වයඹ යන පළාත්වල භාවිතවන ගුවන්විදුලි යන්ත්‍ර සංඛ්‍යාව සහ මධ්‍යම තරංග ඔස්සේ සවන්දෙන යන්ත්‍ර සංඛ්‍යාව 21% කි.

1.2 මෙම පළාත්වල ගුවන්විදුලි යන්ත්‍ර වැඩි සංඛ්‍යාවක් එෆ්.එම්. තරංගමාලා සහිත වන අතර එම ප්‍රමාණය 97.8 % කි.

1.3 මධ්‍යම තරංග සහිත ගුවන්විදුලි යන්ත්‍ර ප්‍රතිචාරකයන්ගෙන් 30%ක් ගුවන්විදුලියට සවන් දෙති.

- අසන්නන්ගෙන් වැඩි ප්‍රමාණයක් ප්‍රධාන ප්‍රවෘත්තිවලට සවන් දෙති.
- දෙවනුවට වැඩි පිරිසක් සවන් දෙන්නේ ආගමික වැඩසටහන්වලටය.

2. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දේශීය සේවාවන්හි ශ්‍රවණ තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් 2015 වර්ෂයේදී පැවැත් වූ අතර එහි වාර්තාව 2016 ජනවාරි 31 වෙන දින ඉදිරිපත් කරනු ලැබිණි. එමගින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි සේවාවන්හි ශ්‍රවණ තත්ත්වයේ අපහැදිලි ස්ථාන කිහිපයක් හඳුනා ගත හැකි විය.

3. ගුවන්විදුලි වැඩසටහන් හි ගුණාත්මක බව වැඩි කිරීමට වැඩසටහන් ඇගයීම සිදු කිරීම.

   මෙම වර්ෂයේ දී සිටි එෆ්.එම්. , සිංහල ස්වදේශීය සේවය සහ සිංහල වෙළෙඳ සේවා වැඩසටහන්වල ඇගයීම් සිදු කරන ලදී. එහිදී සාධණීය සහ දියුණු කර ගත යුතු ලක්ෂණ කිහිපයක් හඳුනා ගතහැකි විය.

4. දෙස් විදෙස්හි දිනයේ වැදගත් සිදුවීම ඇතුළත් තොරතුරු පිළිබඳව අසන්නන් දැනුවත් කිරීමේ අරමුණින් ඒවා වැඩසටහන් අංශයට දිනපතා සැපයීම

5. ගුවන්විදුලිය පිළිබඳව අධ්‍යයනය කිරීමට පැමිණෙන පාසල් සහ විශ්ව විද්‍යාල පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු මහජන සේවයක් සේ සලකා ලබාදීම.

## අලෙවි අංශය

2015 වසරේදී ගුවන්විදුලි සංස්ථා අලෙවි අංශය **ICC** ලෝක කුසලාන තරඟාවලියේ නිල ගුවන්විදුලිය ලෙස ක්‍රියා කර ඇති අතර වසර තුළ ක්‍රියාත්මක වූ ජාත්‍යන්තර ක්‍රිකට් තරඟාවලි සඳහා නිල ගුවන්විදුලිය ලෙස ක්‍රියාකරමින් ආදායම් උපයා ඇත.

ආදායම් උත්පාදන අභිවර්ධනය සඳහා නව අලෙවි විධායකවරුන් බඳවා ගැනීම, නව ක්‍රමෝපායන් සහිත නව ව්‍යාපාර හඳුන්වා දීම තුළින් අලෙවි අංශය 2015 වර්ෂයේ ආදායම් ඉපැයීම සඳහා ක්‍රියාකර ඇත.

එසේම ජාතික වශයෙන්, ආගමික වශයෙන්, සංස්කෘතික වශයෙන් වැදගත් අවස්ථා අලළා සකස්කරන ලද විවිධ වැඩසටහන්හි නිල ගුවන්විදුලිය ලෙස සම්බන්ධ වෙමින් ආදායම් ඉපැයීමට ක්‍රියා කර ඇත. උදාහරණ වශයෙන් බුද්ධ රශ්මි වෙසක් කලාපය, පසළොස්වක පොහොය වැඩසටහන්, රත්නපුර සමන් දේවාල පෙරහැර, රාමසාන් උත්සව සමය ආදී විවිධ අංග දැක්විය හැකිය.

2015 වසරේ විශේෂ ආදායම් ඉපැයීමේ මාර්ගයක් ලෙස මැතිවරණය අළලා දියත් කළ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් දැක්විය හැකිය.

## ඉංජිනේරු අංශය

2015 වර්ෂයේ දී 166.6ක මුදලක් වැයකර කරගහතැන්න සම්ප්‍රේෂණාගාරය යාවත් කාලීන කිරීමේ ව්‍යාපෘතිය සිදුකරන ලදී. ඒ යටතේ පහත සඳහන් කාර්යයන් සිදුකර ඇත.

- 5 kw ධාරිතාවයෙන් යුත් සම්ප්‍රේෂණ යන්ත්‍ර වෙනුවට 10 kw ධාරිතාවයකින් යුත් සම්ප්‍රේෂණ යන්ත්‍ර 07ක් ස්ථාපනය කිරීම.
- නව සම්බන්ධක 07ක් ස්ථාපනය කිරීම.
- නව ජනක යන්ත්‍රයක් මිලදීගෙන ස්ථාපනය කිරීම.
- නව ඇන්ටනා පද්ධතියක් ස්ථාපනය කිරීම.
- නව UPS පද්ධතියක් ස්ථාපනය කිරීම

# ගිණුම් ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
(සියලූම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| | සටහන | දෙසැම්බර් 31 2015 | දෙසැම්බර් 31 2014 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 9 | 2,450,480,855 | 2,735,137,013 |
| විලම්භිත බදු වත්කම් | | (409,678) | 945,105 |
| සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ | 10 | 254,571,510 | 142,180,474 |
| ආයෝජන | 11 | 1,000,000 | 1,000,000 |
| | | 2,715,642,688 | 2,879,262,,593 |
| **ජංගම වත්කම්** | | 17,028,803 | 31,862,620 |
| තොග භාණ්ඩ | 12 | 225,841,248 | 223,458,698 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 13 | 4,852,069 | 5,294,505 |
| මාර්ගස්ථ භාණ්ඩ | 14 | 260,851,452 | 101,096,412 |
| මුදල් හා මුදලට සමාන දෑ | | 518,573,572 | 361,712,236 |
| | | **3,234,216,259** | **3,240,974,829** |
| **මුළු වත්කම්** | | | |
| **ස්කන්ධ සහ බැරකම්** | | 307,366,085 | 307,386,085 |
| | | 14,421,999 | 14,421,999 |
| **ප්‍රාග්ධන හා සංචිත** | 15 | (174,112,871) | (248,365,120) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | **147,695,213** | **73,442,964** |
| ප්‍රත්‍යාගණන සංචිත | | | |
| රඳවාගත් ඉපැයුම් | | 239,321,738 | 222,655,326 |
| | | 79,909,399 | 84,949,026 |
| **ජංගම නොවන බැරකම්** | | 629,025,361 | 444,048,924 |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | | 1,646,092,816 | 1,897,474,699 |
| විලම්භිත ආදායම (ජපාන ප්‍රදානය) | 18 | 75,733,399 | 85,864,191 |
| රජයේ ප්‍රදානය | | - | 4,494,231 |
| ත්‍රිකුණාමල ව්‍යාපෘතිය ප්‍රදානය | | **2,670,082,712** | **2,739,486,397** |
| විලම්භිත බදු බැරකම් | 16 | | |
| කල්බදු ගිණුම (රථ වාහන) | 17 | 277,967,880 | 286,403,409 |
| | | 138,470,454 | 141,642,059 |
| **ජංගම බැරකම්** | | **416,438,334** | **428,045,468** |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | | **3,234,216,259** | **3,240,974,829** |
| මූල්‍යමය නොවන බැරකම් | | | |
| මුළු බැරකම් | | | |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | | |

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1971 අංක 38 දරන මූල්‍ය පනත සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සමග අනුකූල වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව මුදල් අධ්‍යක්ෂ සහතික කරයි.

.................................................. දිනය - 04.04.2016

ලලිත් හෙට්ටිගේ මහතා
අධ්‍යක්ෂ - මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශ 2016 .03.31 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදී.

..............................    ............................

නන්ද මුරුත්තෙට්ටුවේගම    අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

දිනය 04.04.2016

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

විස්තීරණ ආදායම් ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| | සටහන | 2015 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා | 2014 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා |
|---|---|---|---|
| විකුණුම් | 1 | 493,081,396 | 539,549,564 |
| විකුණුම් පිරිවැය | 2 | 458,736,507 | 386,959,821 |
| **දළ ලාභය** | | **34,344,889** | **152,589,743** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | 3 | 464,855,137 | 413,610,429 |
| බෙදාහැරීම් පිරිවැය | 4 | **73,809,637** | 74,962,779 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 5 | 393,219,653 | 407,905,643 |
| පරිපාලන වියදම් | 6 | 313,682,908 | 328,388,825 |
| | | **(281,512,171)** | **(245,057,075)** |
| **මෙහෙයුම් ලාභය** | 7 | 6,213,541 | 8,893,605 |
| මූල්‍ය පිරිවැය | | (247,725,712) | **(253,950,680)** |
| **රජයේ ප්‍රදානයට පෙර ලාභය/(අලාභ)** | 3.1 | 350,000,000 | 218,160,000 |
| | | **62,274,288** | **(35,790,680)** |
| රජයේ ප්‍රදානය | 8 | 8,776,009 | (20,410,762) |
| රජයේ ප්‍රදානයෙන් පසු ලාභය/(අලාභ) | | **71,050,297** | **(56,201,442)** |
| බදු වියදම් | | **71,050,297** | **(56,201,442)** |
| **බදුවලින් පසු ලාභය** | | | |
| මුළු විස්තීරණ ආදායම | | | |

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය
(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2013 ජනවාරි 1 දිනට ශේෂය | | 307,386,085 | | 14,421,999 | - | 321,808,084 |
| **විස්තීරණ ආදායම** | | | | | | |
| වසර සඳහා විස්තීරණ ආදායම | | | | | (56,201,442) | (160,806,365) |
| ආදායම් සංචිත ගැලපීම-2014 | | | | | (219,291,340) | 17,138,355 |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **307,386,085** | | **14,421,999** | **(248,365,120)** | **(248,365,120)** |
| විස්තීරණ ආදායම | | | | | | |
| කාලසීමාව සඳහා විස්තීරණ ආදායම | | | | | (71,050,297) | (71,050,297) |
| ආදායම් සංචිත ගැලපුම-2015 | | | | | 3,201,952 | 3,201,952 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **307,386,085** | | **14,421,999** | **(174,112,871)** | **147,695,213** |

## 2015 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | 62,274,288 | | (50,629,337) |
| බදු සහ පොළීවලට පෙර ශුද්ධ ලාභය | | | | |
| **පහත සඳහන් දෑ සඳහා ගැලපුම්:** | (57,975,190) | | (62,272,581) | |
| රජයේ ප්‍රදානයේ ක්‍රමක්ෂය | (177,769,097) | | (177,769,097) | |
| ත්‍රිකුණාමල ප්‍රදානයේ ක්‍රමක්ෂය | 43,621,211 | | 50,005,060 | |
| ක්ෂයවීම | 182,364,130 | | 178,531,044 | |
| ක්ෂයවීම-ත්‍රිකුණාමලය | 23,335,178 | | 44,218,603 | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | 3,775,144 | | 2,541,373 | |
| බොල් ණය සඳහා ප්‍රතිපාදනය | 176,576 | | | |
| වත්කම් බැහැරකිරීම මත ලාභය(අලාභය) | 1,045,145 | | 170,572 | |
| විනිමය මත ලාභ (අලාභ) | 5,947,058 | | 2,490,894 | |
| කල්බදු පොළී | 1,807,365 | 26,327,519 | | 44,189,166 |
| ආ.සේ.ගා. | | | 6,273,298 | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභ** | 4,833,817 | | 3,806,233 | |
| | (6,157,694) | | 2,206,428 | |
| | 442,436 | | (2,053,368) | 32,245,730 |
| තොග වැඩිවීම/ අඩුවීම | 4,882,736 | (10,743,147) | 16,485,451 | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම | (4,978,970) | | 11,800,986 | |
| | | (6,668,767) | | (10,104,537) |
| මාර්ගස්ථ භාණ්ඩවල වැඩිවීම/ අඩුවීම | | | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම | | | | 15,701,022 |
| මූල්‍ය නොවන බැරකම්වල වැඩිවීම/ අඩුවීම | | | | |
| | | 71,189,893 | | |
| ගෙවන ලද පාරිතෝෂික | 230,300,958 | | 218,002,836 | 83,615,527 |
| ගෙවන ලද බදු | (19,684,821) | | (13,191,090) | |
| | (112,958,823) | 97,657,315 | (121,196,219) | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්** | | | | |
| **ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | | | |
| රජයේ ප්‍රදානය | | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | | (9,902,168) | | 83,050,156 |
| කල්බදු කුලිය ගෙවීම | (9,902,168) | | | |
| සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ | | 159,755,040 | | 18,046,256 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතාකළ ශුද්ධ මුදල් | | 101,096,412 | | |
| | | <u>260,851,452</u> | | <u>101,096,412</u> |

| | | | | |
|---|---|---|---|---|
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ කල්බදු කුලිය ගෙවීම<br><br>මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම/ අඩුවීම<br><br>කාල සීමාව ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ<br><br>කාල සීමාව අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ | | | | |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. සාමාන්‍ය තොරතුරු

## 1.1 වාර්තාකරණ අස්තිත්වය

1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත යටතේ නිසි පරිදි සංස්ථාගත කොට ස්ථාපනය කොට ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇත.

## 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වසර තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ගුවන් කාලය විකිණීමයි.

## 1.3 නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

2015 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 31 වන දින අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

## 1.4 සේවක සංඛ්‍යාව

වසර අවසානයේදී ස්ථිර සේවක සංඛ්‍යාව 872 කි.

වසර අවසානයේදී කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව 53 කි.

(2014.12.31 - 889)

## 2. පිළියෙල කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යොදාගැනීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.) සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නව වෙළුමක් නිකුත් කර ඇති අතර 2012 ජනවාරි 01 සිට හෝ ඉන් පසුව ආරම්භ වන වසර සඳහා බලාත්මක වන පරිදි ව්‍යවසායන් මෙම ප්‍රමිති ආදේශ කිරීම අවශ්‍ය කරනු ලබයි.

### 3.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත විස්තර කොට ඇත. අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කර ඇති සියලූ වසර සඳහා මෙම ප්‍රතිපත්ති සංගතව ආදේශ කර ඇත.

### 3.1.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සහ පසුව පැහැදිළි කොට ඇති අනෙකුත් නිශ්චිත මැනුම් යටතේ පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පිණිස තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. එසේම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේ ක්‍රියාදාමයේදී කළමනාකාරිත්වය සිය විනිශ්චය ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂෙත්‍ර සටහන් 4 හි හෙළිදරව් කොට ඇත ඊට වත්කම් සහ බැරකම් වාර්තා කොට ඇති ප්‍රමාණ සහ මූල්‍ය වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීම සහ වාර්තාකරණ කාලසීමාව තුල ආදායම සහ වියදම් ප්‍රමාණ පිළිබඳ වාර්තාව අයත් වේ. වත්මන් සිදුවීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකාරිත්වයේ උපරිම දැනුම මත මෙම ඇස්තමේන්තු පාදක වූවත් අවසානයේදී තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැක.

### 3.1.2 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් සිදු කර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

### 3.1.3 පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සියළු ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකොට හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

### 3.1.4 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් සංගතව යොදාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අන්‍යාකාරයෙන් සඳහන් කර

ඇත්තේනම් මින පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තන්හිදී පෙර වසරේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

### 3.1.5 විදේශ ව්‍යවහාර මුදල්

(අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර ඇති අයිතම මණිනු ලබන්නේ අස්තිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය යොදා ගනිමිනි (කෘත්‍යාත්මක මුදල් ඒකකය). මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සංස්ථාවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

### (ආ) විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සහ ශේෂය

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුකළ දිනයන්හිදී පැවති විනිමය අනුපාතය හෝ අයිතම මනිනු අවස්ථාවන්හිදී වටිනාකම යොදාගනිමින් කෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සහ විදේශ මුදලින් අභිධාන කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වසර අවසාන විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේදී ඇතිවන විදේශ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

## 3.2 අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.2.1 වත්කම් සහ ඒවායේ මැණීමේ පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය ඇති වත්කම් වනුයේ මුදල් සහ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතුවල සමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුල යන දෙකින් වඩා කෙටි කාල සීමාව තුල මුදලින් උපලබ්ධිවීමට අපේක්ෂිත දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වසරක කාල සීමාවක් ඉක්මවා රඳවා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

### 3.2.1.1 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි සමන්විත වනුයේ මූලිකවම ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානවලිනි. සියලූ දේපල, පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයට ප්‍රකාශ කරනු ලැබ ඇත. දේපල පිරියත හා උපරකණවල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සමගින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාළ වත්කම වැඩ කරන තත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදුවන ආනුෂංගික වියදම් ද වේ. වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගමට පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය වත්කමේ ධාරණ අගයට ඇතුලත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතමය තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

### 3.2.1.2 ප්‍රතිසංස්කරණ පිරිවැය

ආරම්භයේදි තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීමට හෝ නඩත්තු කිරීමට දරන ලද වියදම, එලෙස වියදම දැරූ අවස්ථාවේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

### 3.2.1.3 ක්ෂයවීම

ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනය ගණනය කර ඇත්තේ සියලූ දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනම යොදාගනිමිනි. මේ සඳහා යොදාගත් ප්‍රධාන වාර්ෂික අනුපාත වනුයේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 7.5% |
| ශ්‍රව්‍ය සංඛ්‍යාන උපකරණ | 7.5% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් සහ උපකරණ | 10% |
| සම්ප්‍රේෂක | 7.5% |
| රථ වාහන | 25% |
| සංගීත භාණ්ඩ | 10% |
| පරිගණක උපකරණ | 50% |
| පටිගත කිරීමේ පටි | 33.33% |
| සුළු උපකරණ | 50% |
| පරිගණක මෘදුකාංග | 25% |

සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදීම, උචිත නම් වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂයකිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කොට ගලපනු ලැබේ.

වත්කමක ධාරණ මුදල එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි මුදලට වඩා වැඩි වන්නේ නම්, එය වහාම එහි අයකරගත හැකි මුදලට පොත් කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ඒවායේ ධාරණ වටිනාකමට සාපේක්ෂව වන අතර මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද විකුණනු ලබන විටදී, අනෙකුත් සංචිතවල ඇතුලත් කර ඇති වටිනාකම් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලැබේ.

### 3.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ යනු වත්කමක් ඉදිකිරීමකට ඍජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය වේ. නොනිමි වැඩ එය සාරනුකූලව සම්පූර්ණ කරනු ලැබූ විටදී සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් විටදී අදාළ වත්කම් ගිණුම්වලට මාරුකරනු ලැබේ.

### 3.2.3 මූල්‍ය වත්කම්

### 3.2.3.1 වර්ගීකරණය

### 3.2.3.2 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරණ කාල සීමාව අවසානයේදී මාස 12 කට වඩා වැඩි කල්පිරීම් සඳහා හැරුණු විට, ඒවා ජංගම වත්කම්හි ඇතුලත් කරනු ලැබේ. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ශේෂ පත්‍රයේ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ සහ මුදල් සහ මුදලට සමාන දේවලිනි සමන්විත වේ. (සටහන් 3.8 සහ 3.9)

### 3.2.3.3 අලෙවියට තිබෙන මූල්‍ය වත්කම්

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් වන්නේ මේ කාණ්ඩයේ නිශ්චය කරනු ලැබ ඇති හෝ වෙනත් කාණ්ඩ කිසිවක වර්ගීකරණය වී නැති ව්‍යුත්පන්න නොවන ඒවාය. වාර්තාකිරීමේ කාල සීමාව අවසානයේදී මාස 12ක් ඇතුළත ආයෝජනය කල් පිරෙන්නේ නම් හෝ ඒ කාලය තුළ එය බැහැර කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අදහස් කරන්නේ නම් මිස ඒවා ජංගම නොවන වත්කම්වලට ඇතුළත් කරනු ලැබේ.

### 3.2.3.4 පිළිගැනීම සහ මැණීම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට දැක්වෙන මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකමට පිළිගනු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හිලව් කොට දක්වනු ලැබේ. ආයෝජනවලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වී ඇති විටදී හෝ හිමිකාරිත්වයේ සියලූ අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලැබ ඇති විටදී මූල්‍ය වත්කම් පිළිගැනීම අවසන් කරනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් තදනන්තරව සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින්ණය සහ ලැබිය යුතු දෑ තදනන්තරව ක්‍රමක්ෂිත මිලට දක්වනු ලැබේ.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් කාණ්ඩයේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලින් මතුවන ලාභහෝ අලාභ ඒවා මතුවන කාල සීමාව තුල අනෙකුත් (අලාභ)/ලාභ - ශුද්ධී හි ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් වර්ගීකරණය කර ඇති මුදල් හො මුදල් නොවන සුරැකුම්පත්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අලෙවියට තිබෙන ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් විකුණනු ලබන විටදීහෝ හානි වූ විටදී, ස්කන්ධයේ පිළිගනු ලබන සමුච්චිත සාධාරණ වටිනාකමේ ගැලපීම් ආයෝජන සුරැකුම්පත්වලින් ලාභ හෝ අලාභී ලෙස ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අලෙවියට තිබෙන සුරැකුම්පත් මත පොළිය අනෙකුත් ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### 3.2.3.5 මූල්‍ය වත්කම් හානි

### (අ) ක්‍රමක්ෂිත පිරිවැයට දැක්වෙන වත්කම්

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන්හි ( හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත

අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මිණිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.

ණය හිමියෝ හෝ ණය හිමියන් සමූහයක් සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් සඳහා එළඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම් හා සහසම්බන්ධ වන හිඟ මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්වයන් බඳු ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මිණිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් විය හැක.

ණය සහ ලැබිය යුතු දේ කාණ්ඩය සඳහා, හානියේ ප්‍රමාණය මණිනු ලබනුයේ වත්කමෙහි ධාරණ මුදල සහ මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වත්කමෙහි ධාරණ මුදල  අඩු කර අලාභයේ ප්‍රමාණය පිළිගනු ලැබේ. යම් ණයක හෝ කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජනයක විචල්‍ය ණය අනුපාතයක් තිබේනම්, කිසියම් හානි අලාභ මැණිම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වත්මනෙහි ක්‍රියාත්මක පොළී අනුපාතයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොල මිලක් යොදාගනිමින් සාධන පත්‍රයක සාධාරණ වටිනාකම පාදකව සංස්ථාව හානිය මැටමට ඉඩ තිබේ.

තදනන්තර කාල සීමාවකදී, හානියේ අලාභයේ ප්‍රමාණය අඩුවී එම අඩුවීම හානිවීම පිළිගැනීමෙන් පසු සිදුවූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම් (ණය හිමියාගේ ණය ප්‍රමාණකිරීම වැඩි දියුණුවීමක් බඳු), කළින් පිළිගත් හානිවීමේ අලාභයේ  ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

### 3.2.3.6 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධිකළ හැකි වටිනාකමට දක්වනු ලැබේ. ලැබිය යුතු දෑ පිළිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලූ මුදල් ප්‍රමාණ සංස්ථාවට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇති විටදී වෙළඳ අයවිය යුතු දේවල හානිවීම සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කෙරේ. ණය ගැතියා මුහුණ දෙන සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බුන්වත් බවට පත්වීම හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළඳ ලැබිය යුතු දෑ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් වත්කමේ ධාරණ වියදම අඩුකරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ පිරිවැය තුළ පාඩු මුදල පිළිගනු ලැබේ.  වෙළඳ ලැබීමක් එකතු කර ගත නොහැකි වන විට ලැබිය යුතු වෙළෙඳ මුදල් සඳහා දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ. කලින් ලියා හරින ලද මුදල් තදනන්තරව ආපසු අයකර ගැනීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදා හැරීමේ පිරිවැයට බැරකරනු ලැබේ.

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා හානිවීම සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

### 3.2.6 තොග

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.

### 3.2.7 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑට අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලූම් තැන්පතු මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ

ද්‍රවශීලතාවක් ඇති ආයෝජන සහ බැංකු අයිරා අයත් වේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ බැංකු අයිරා පෙන්නුම් කරනු ලබන්නේ ජංගම වගකීම් තුළ ණය ගැනුම් ලෙසය.

### 3.2.8 ණය ගැනුම් පිරිවැය

ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් කිරීම සඳහා අවශ්‍යයෙන්ම සැළකියයුතු කාල සීමාවක් ගන්නා වූ වත්කම් වන් සුදුසුකම් ලබන වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය වෙත් සෘජුවම ආරෝපණය සාමාන්‍ය හෝ නිශ්චිත ණය ගැනුම් පිරිවැය, එකී වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සාරනුකූලව සූදානම් කරන කාලය තෙක් එම වත්කම්වලට පිරිවැයට එකතු කරනු ලැබේ.

නිශ්චිත ණය ගැනුම්හි තාවකාලික අයෝජන මත උපයනු ලැබූ ආයෝජන ආදායම, සුදුසුකම් ලබන වත්කම් මත ඒවායේ වියදම තීරණය කරන තෙක් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ඇති ණය ගැනුම් පිරිවැයෙන් අඩුකරනු ලාබේ.

අනෙකුත් සියලූ ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාල සීමාව තුළ ලාභ හෝ අලාභයන්හි පිළිගනු ලැබේ.

### 3.2.9 ජංගම සහ විලම්භිත බදු

මෙම කාලසීමාව තුළ බදු වියදම් සමන්විත වන්නේ ජංගම සහ විලම්භිත බදුවලිනි. ආදායම් ප්‍රකාශය තුල බදු පිළිගනු ලබන්නේ අනෙකුතු විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ගණන් ගනු ලබන අයිතමවලට ඒවා අදාළ වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයටය. මෙහිදී පිළිවෙලින් අනෙකුත් විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ද බදු ගණන් ගැනේ.

### අ) ජංගම බදුකරණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධාන අනුව සමාගමට ජංගම බදු බැරකම් ඇතිවේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කළමනාකාරිත්වය විශ්වාස කරන යථෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශවල මේ බැරකම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ. ගනුදෙනු පිළිබඳව සංස්ථාව විසින් ගනු ලැබූ ස්ථාවරය අදායම් අධිකාරීන් විසින් අභියෝගයට ලක්කරන අවස්ථා තිබිය හැක. මෙම කරුණු නිසා ඇතිවන කවර හෝ අතිරේක පිරිවැයක් සංස්ථාව මත බැරකම තහවුරු කරන අවස්ථාවේ බදු වියදමක් ලෙස ගිණුම් ගත කරනු ලැබේ.

ප්‍රවර්තන වසර සහ පෙර කාල සීමාවන් සඳහා ජංගම බදු වත්කම් සහ බැරකම් මණිනු ලබන්නේ ආදායම් අධිකාරියට ආපසු අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණයන්ගෙනි. ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිතා කළ බදු අනුපාත හෝ බදු නීති වනුයේ ශේෂ පත්‍ර දින වන විට පනවනු ලබන හෝ සත්තාවීව පනවනු ලබන ඒවාය. ජංගම බදු සඳහා ප්‍රතිපාදන පදනම් වනුයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කර ඇති පරිදි ආදායම් සහ වියදම් අංග පදනම්වය.

### ආ) විලම්භිත බදුකරණය

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මුල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත ශේෂ පත්‍ර ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු අයකළ හැකි ලාභයට බල නොපාන ගනුදෙනුවකදී වත්කම් සහ බැරකම් ආරම්භක පිළිගැනීමෙන් මතුවන තාවකාලික වෙනස්කම් සහ පූර්වේක්ෂිත අනාගතයේ ප්‍රතිවර්තනය නොවීමට ඩට ඇති ප්‍රමාණයට අයෝජන ආශ්‍රිත වෙනසකම් සඳහා විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. ඊට අමතරව, කීර්ති නාමය ආරම්භක පිළිගැනීම මත මතුවන බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා ද විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ සත්තාවීව පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම්

ප්‍රතිවර්තනය වන විටදී යොදා ගැනීමට අපේක්ෂා කරන ලබන බදු අනුපාතයන්ට විලම්භිත බදු ගණනය කෙරේ. ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහ බදු අධිකාරීන් විසින්ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලබිහිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනසකම් උපයෝජනය සඳහා යොදාගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ඇතිවිය හැකි තාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්භිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධි වීම තවදුරටත් සිදු නොවිය හැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ.

### 3.2.10 සේවක ප්‍රතිලාභ

### 3.2.10.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

## අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් හැරුණු කොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව මූල්‍ය ප්‍රකාශනයේ පිළිගනු ලබන බැරකම වාර්තාකරණ දිනයට නිර්වචිත බැඳීමේ වත්මන් වටිනාකමයි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම නිර්ණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම වට්ටම් කිරීම මගිනි.

ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන්හි සහ ආශ්‍රිත බැරකමේ කාල සීමාවන්ට සමීප වන්නා වූ කල්පිරීමේ කාලසීමා සහිත පොළී අනුපාත භාවිතා කරමින් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (2006 ප්‍රතිශෝධිත) අනුකූල වන පරිදි සියලූ ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ  පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

මෙම බැරකම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ. ආයුගණකගේ ප්‍රධාන උපකල්පනයන්ට පහත දෑ ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| (1) | පොළී අනුපාතය | 11 % |
| (2) | වැටුප් වර්ධක අනුපාතය | 5% |
| (3) | සියලූ සේවකයන්ගේ විශ්‍රාම ගන්නා වයස අවරුදු 60 | |

## (ආ) නිර්වචිත දායක සැලසුම් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා සුදුසුකම් සහිත සියලූම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වඩචිත දායක සැලැසුම් සඳහා දායක මුදල් දරන ලද විටදී ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.2.11 රජයේ ප්‍රදාන

ප්‍රදානයට අදාළ කොන්දේසිවලට සමාගම අනූකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ

සහතිකයක් ඇත්නම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර හානිපූරණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය සමග ඒවා ගැලපීම පිණිස අවශ්‍ය කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම්වල ඇතුලත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම්වල අපේක්ෂිත ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

### 3.2.12 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සංස්ථාව සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය විම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටිදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

### 3.2.13 අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් හට ගැනීම හෝ හට නොගැනීම මගින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් හෝ එකී බැඳිමෙන් නිදහස් වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීම සඳහා සම්පත් බැහැරට ගලා යෑමක් සිදුවීමේ හැකියාවක් නැති නිසා පිළිනොගැනෙන වර්තමාන බඳීමකින් හෝ පැන නැගීමට හැකියාවක් ඇති බැඳීමකි. විශ්වසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින බෙහෙවින් දුර්ලභ අවස්ථාවලදී ද බැරකමක් හඳුනා නොගන්නා නමුත් එවැන්නක පැවැත්ම මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හට ගැනීමෙන් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් පැන නැගීමට ඉඩ ඇති වත්කමකි. සංස්ථාව අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලා ඒම් සිදුවිය හැකි වූවත් එය සැබවින්ම ස්ථිර නොවන අවස්ථාවලදී එවැනි දේවල පැවැත්ම අනාවරණය කරයි.

### 3.2.14 වෙළෙඳ ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීමය. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් තුළ හෝ ඊට අඩු කාලයක් තුළ නම් (හෝ ඊට වඩා කාලය දිගුවේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

### 3.2.15 මූල්‍ය කල්බදු බැඳීම්

කල්බදු ගත් අයිතමවල හිමිකමට ආනුෂංගික සියලූ අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස සංස්ථාවට පවරන්නා වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපල, පිරියත හා උපකරණ කල්බද්ද ආරම්භයේදි කල්බදු ගත් දේපලේ සාධාරණ වටිනාකමට හෝ වඩා අඩුනම් සමුච්චිත ක්ෂයවීම

අඩුකොට ආරම්භයේදී අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනායිත කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු පොළිය අවිනිශ්චිත පොළියක් සේ ගිණුම් ගත කරනු ලැබේ. අනුරූපී ණය බදු දීමනාකරුට ගෙවිය යුතු මුදලක් සේ වාර්තා කරනු ලැබේ. ගෙවන ලද වාරික බැරකම අඩුකිරීම සඳහා යොදා ගනු ලැබේ.

වසර සඳහා අයකරන පොළිය පොළී අවිනිශ්චිත ගිණුමේ සිට ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

## 3.2.16 ආදායම් ප්‍රකාශනය

### 3.2.16.1 ආදායම පිළිගැනීම

ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම ගණන් ගනු ලබන අතර සපයන ලද සේවා සඳහා ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර වට්ටම් සහ වටිනාකම එකතු කළ බදු අඩුකොට සඳහන් කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වසනීය ලෙස මැණිය හැකි විටදීඃ අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ප්‍රවාහය වීමට ඉඩ ඇති විටදීඃ සහ සංස්ථාවේ එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇති විටදී සංස්ථාව ආදායම පිළිගනියි. පහත විස්තර කර ඇති පරිදි, ගනුදෙනුකාර වර්ගය, ගනුදෙනු වර්ගය සහ එක් එක් සැකසුමේ නිශ්චිත තොරතුරු සැලකිල්ලට ගනිමින් සංස්ථාව සිය ප්‍රතිලාභ ඇස්තමේන්තු ඓතිහාසික ප්‍රතිඵල මත පදනම් කර ගනී.

### (අ) ගුවන් කාලය අලෙවිය

ආදායම ගුවන් කාලය විකිණීමෙන් සමන්විත වෙයි. වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන විටදී ගුවන් කාලය විකිණීමේ ආදායම පිළිගනු ලැබේ.

### (ආ) පොළි ආදායම

එකතු කර ගැනීමට හැකි බව පිළිබඳ සැකයක් ඇත්නම් මිස කාල පදනමින් උපචිතවූ පොළිය ලෙස (වත්කමේ සඵල ඵලදාව සැලකිල්ලට ගනිමින්) පොළී ආදායම පිළිගනු ලැබේ.

### (ඇ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් ආදායම දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම සමග සැසඳීමෙන් වන අතර ආදයම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### (ඈ) වෙනත් ආදායම්

අනෙකුත් සියලූ ආදායම් පිළිගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

## 3.2.17 වියදම් පිළිගැනුම

### (අ) මෙහෙයුම් වියදම්

ආදායම් ප්‍රකාශයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර ඍජු සබඳතා පදනම මතය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දරනු ලබන සියලූ වියදම් වර්ෂයේ ලාභ/පාඩු නිගමනය කිරීමේදී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා සියලූ බැරකම් සහ දේපල, පිරියත හා උපකරණ මත ක්ෂයවීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

## (ආ) මූල්‍ය වියදම්

පොළී ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ණයගැනුම් පිරිවැය ඒවා දරන ලද කාල සීමාවේදී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

## 3.2.18 තුලනාත්මක සංඛ්‍යා

අවශ්‍ය අවස්ථාවලදී ප්‍රවර්තන වර්ෂය තුළ කරනු ලබන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වනු පිණිස තුලනාත්මක  සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

# 4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තා  කර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. කෙසේ වෙතත් මෙම උපකල්පන සහ ඇස්තමේන්තු  පිළිබඳ අවිනිශ්චිතතාව, අනාගත කාල සීමාවන්හි සිදුකරනු ලබන වත්කම් හෝ බැරකම්වල ධාරණ වටිනාකමට ද්‍රව්‍යමය වෙනස්කම් අවශ්‍ය කරන්නා වූ ප්‍රතිඵල ඇතිකිරීමට හැක.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් පහසුවෙන් හඳුනාගත නොහැකි වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය බැරකම්වල ධාරණ ප්‍රමාණ පිළිබඳ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමේදී පදනම සකස්කරන්නා වූ අවස්ථානුගත තත්වයන් යටතේ සාධාරණයැයි විශ්වාස කරනු ලබන අනෙකුත් විවිධ සාධකවල ප්‍රතිඵල මත පදනම් වී ඇත.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, එකී ප්‍රතිශෝධන වත්මන සහ අනාගත කාල සීමා සඳහා බලපාන්නේ නම් එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාල සීමාවේදී පිළිගනු ලැබේ. ශ්‍රී.ල.ගි.ප්‍ර යොදා ගැනීමේදී කළමනාකාරිත්වය විසින් සිදුකරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළ හැක.

## (අ) විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිත කරමින් ආයුගණක පදනමක් මත නිර්ණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) නිශ්චය කිරීමේදී යොදා ගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය ඇතුලත් වේ. මෙම උපකල්පනයන්හි කවර හෝ වෙනසක් විශ්‍රාම වැටුප් බැඳීම්වල ධාරණ මුදල් ප්‍රමාණය කෙරෙහි බලපානු ඇත.

උචිත වට්ටම් අනුපාතය සෑම වසරක් අවසානයේදීම  සංස්ථාව නිශ්චය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් බැඳීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන අනාගත මුදල් ගලායාම්හි වර්තමාන වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතා කළ යුතු පොළී අනුපාතය වන්නේ මෙයයි. උචිත වට්ටම් අනුපාතය නිශ්චය කිරීමේදී සංස්ථාව ආයතනික බැඳුම්කරවල පොළී අනුපාත සැලකිල්ලට ගනියි. විශ්‍රාම වැටුප් බැඳීම් අනෙකුත් ප්‍රධාන උපකල්පන වත්මන් වෙළෙඳපොල තත්වයන් මත ද අර්ධ වශයෙන් පාදක වේ.

## (ආ) ආදායම් බදු ආදායම

සංස්ථාව ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය නිශ්චය කිරීමේදී සැළකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇති අතර ඒ සඳහා අවසාන බදු

නිශ්චය කිරීම අවිනිශ්චිතය. අතිරේක බදු ලැබීමට නියමිත ද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පාදකව අපේක්ෂිත බදු විගණන ගැටළු සඳහා සංස්ථාව බැරකම් පිළිගනු ලැබේ. මෙම කරුණුවල අවසාන බදු ප්‍රතිඵලය ආරම්භයේදී වාර්තා කළ ප්‍රමාණයන්ට වඩා වෙනස්වන විටදී, එම වෙනස්කම් එවැනි නිශ්චයකිරීම් සිදුකරනු ලැබූ කාල සීමාව තුල ජංගම සහ විලම්භිත ආදායම් බදු වත්කම් සහ බැරකම් කෙරෙහි බලපානු ඇත.

## 5. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 5.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් එය මූල්‍ය අවදානම් මිශ්‍රණයකට නිරාවරණය කරයිඃ වෙළඳපොළ අවදානම, ( ව්‍යවහාර මුදල්, සාධාරණ වටිනාකම පොළී අනුපාත අවදානම, මුදල් ප්‍රවාහ පොළී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළුව) ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම ඒ අතර වේ. සංස්ථාවේ සමස්ත ණය කළමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය මත අහිතකර බලපෑම් ඇතිකළ හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඉලක්ක ගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කළමනාකරණය සිදුකරනු ලැබේ.

### (අ) වෙළඳපොළ අවදානම්

### (i) විදේශ විනිමය අවදානම

සංස්ථාව තමන්ට අවශ්‍ය උපකරණ ජාත්‍යන්තරව ආනයන කරන අතර මූලිකවම ඇමෙරිකානු ඩොලර්වලට අදාළව ව්‍යවහාර මුදල් නිරාවරණයන්ගෙන් මතුවන විදේශ විනිමය අවදානම්වලට නිරාවරණය වේ. අනාගත වාණිජ ගනුදෙනුවලින් සහ පිළිගත් වත්කම් සහ බැරකම්වලින් මතුවන සිය විදේශ විනිමය අවදානම් කළමනාකාරණය කිරිම පිණිස සමාගම දේශීය නියෝජිතයන් සමග ගිවිසුම්වලට එළඹේ.

### (ii) මිල අවදානම

වෙළෙඳ භාණ්ඩ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ප්‍රධාන සැපයුම්කරුවන සමග ගිවිසුම්වලට එළඹීම මගින් සංස්ථාව අවදානම් අවමකරයි.

### (iii) ණය අවදානම්

ණය අවදානමට නිරාවරණය වනුයේ මූලිකවම වෙළඳ ලැබිය යුතු දෑ වලින් වන අතර සේවා සැපයීමට පෙර සිය නව ගනුදෙනුකරුවන් සෑම කෙනෙකුම සඳහාම ණය අවදානම කළමනාකරණය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ වගකීම සංස්ථාව සතුය.

ණය අවදානම මතුවනුයේ මුදල් හා මුදලට සමාන දෑ, බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ලැබිය යුතු දෑ සහ වාණිජ ගනුදෙනු වෙත ණය නිරාවරණයවීම් මගිනි. බැංකු සහ මූල්‍ය ආයතන සඳහා, ස්වාධීනව ශ්‍රේණිගත කරනු ලැබූ  අවම වශයෙන් **'A'** ශ්‍රේණිගත කිරීම සහිත පාර්ශව පමණක් පිළිගනු ලැබේ. අවදානම් පාලනය ගනුදෙනුකරුගේ මූල්‍ය තත්වය, අතීත අත්දැකීම් සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් ණය ගුණත්වය තක්සේරු කරනු ලැබේ. අභ්‍යන්තර හෝ බාහිර ශ්‍රේණිගත කිරීම් මත පාදකව කේවල ණය සීමා පනවනු ලැබේ. ණය සීමා උපයෝජනය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.

## (iv) ද්‍රවශීලතා අවදානම්

සංස්ථාව විසින් මූල්‍ය පූර්වකථනය සිදුකරනු ලබන අතර සංස්ථාවේ ද්‍රවශීලතා අවශ්‍යතා සහතික කිරීම පිණිස නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. එබඳු පූර්වකථනයන්හිදී සංස්ථාවේ ණය මූල්‍යකරණ සැලසුම්, ප්‍රඥප්ති අනුකූලතාව සැලකිල්ලට ගනු ලැබේ. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය කරනු ලබන ශේෂයට වඩා සහ ඉහළින් සංස්ථාව විසින් රඳවාගෙන ඇති අතිරික්ත මුදල්, බැඳීම් සපුරාලීම සඳහා යෝග්‍ය කල්පිරීම් සහිත පොළී ආදායම් උපයනු පිණිස කාල තැන්පතුවලට මාරු කරනු ලැබේ.

## 6. ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

| සබඳතාවයේ නම | තනතුර | ගනුදෙනුවේ ස්වභාවය |
|---|---|---|
| නන්ද මුරුත්තෙට්ටුවේගම මයා | සභාපති | නැත |
| ඩබ්ලිව්. ජයසිරි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| දීපිකා ප්‍රියදර්ශනී පීරිස් මෙනෙවිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| චන්ද්‍රිකා කුලතිලක | භාණ්ඩාගාරයේ නියෝජිත | නැත |
| ආචාර්ය අරුන්දතී ශ්‍රී රෙන්ග නාදන් | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| කිත්සිරි සමරසිංහ මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |

### සටහන 1

ආදායම

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014-අනුමත |
|---|---|---|---|---|
| ඒෂියා සේවයේ ගුවන් කාලය විකිණීම | 10,462,728 | 16,854,261 | (670,792) | 17,525,053 |
| T.W.R. ගුවන් කාලය විකිණීම | 86,026,727 | 77,034,801 | | 77,034,801 |
| දේශීය සේවයේ ගුවන් කාලය විකිණීම | 385,846,836 | 433,169,865 | 1,943,769 | 431,226,096 |
| නිෂ්පාදන ගාස්තු- දේශීය සේවය | 4,668,083 | 4,863,033 | | 4,863,033 |
| අවමංගල්‍ය දැන්වීම් | 3,992,713 | 4,322,106 | | 4,322,106 |
| FEBA ගුවන් කාලය විකිණීම | 2,084,309 | 3,111,968 | (270,736) | 3,382,704 |
| PCJ ආදායම | - | 193,530 | 61,260 | 132,270 |
| | 493,081,396 | 539,549,564 | 1,063,501 | 538,486,063 |

## සටහන 2

විකුණුම් පිරිවැය

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| වැටුප්. වේතන සහ දීමනා | 298,565,304 | 195,667,088 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය | 31,311,333 | 26,583,887 |
| සේවක භාරකාර අරමුදලට දායකත්වය | 6,277,520 | 4,924,964 |
| ගමන් සහ යැපුම් දීමනා | 742,040 | 773,952 |
| වැඩසටහන් වියදම් | 7,894,294 | 11,288,409 |
| සහන කාර්යමණ්ඩලය | 10,147,325 | 14,569,139 |
| වාහන ධාවන වියදම් | 4,044,015 | 7,785,725 |
| නඩත්තු පිරිවැය | 3,970,502 | 12,853,663 |
| විදුලිය | 95,784,174 | 112,512,994 |
| | 458,736,507 | 386,959,821 |

## සටහන 3

අනෙකුත් මෙහෙයුම් වියදම්

| **විස්තරය** | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014- අනුමත |
|---|---|---|---|---|
| ණය මත පොළී | 3,207,498 | 2,936,467 | | 2,936,467 |
| විවිධ ආදායම් (වෙනත්) | 59,186,605 | 53,233,894 | 1,609,942 | 51,623,952 |
| අගරුවූ චෙක්පත් වෙනුවෙන් දැන්වීම් | 21,062 | 25,774 | | 25,774 |
| නියෝජිත දඩ | 160,390 | 106,381 | 85,430 | 20,951 |
| නිවාස කුලී | 181,479 | 207,086 | | 207,086 |
| විශේෂ පටිගත කිරීම් | - | 8,571 | | 8,571 |
| ප්‍රමාද බලපත්‍ර සඳහා දඩ මුදල් | 7,336,343 | 8,715,940 | | 8,715,940 |
| ආනයනයකරුවන්, වෙළෙන්දන් සදහා බලපත්‍ර | 4,721,083 | 1,051,394 | (22,321) | 1,073,715 |
| කැසට් පට අලෙවිය | 1,171,160 | 1,799 | | 1,799 |
| දඩ ගිණුම | 80,053 | 802,954 | | 802,954 |
| සංචාරක බංගලාවෙන් ලත් ආදායම- අඹේවෙල | 341,360 | 227,767 | | 227,767 |
| ප්‍රකාශන අලෙවිය | 152,703,817 | 106,250,724 | 246,327 | 106,004,397 |
| ආදායම- ත්‍රිකුණාමල ව්‍යාපෘති | | | | |
| **උප එකතුව** | **229,110,850** | **173,568,751** | **1,919,378** | **171,649,373** |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | 57,975,190 | 62,272,581 | | 62,272,581 |
| ත්‍රිකුණාමල ප්‍රදානය ක්‍රමක්ෂය | 177,769,097 | 177,769,097 | | 177,769,097 |
| උප එකතුව | 235,744,288 | 240,041,678 | | 240,041,678 |
| **මුළු එකතුව** | **464,855,137** | **413,610,429** | **1,919,378** | **411,691,051** |

සටහන 3.1
රජයේ ප්‍රදානය

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| බලපත්‍ර ගාස්තු සඳහා රජයේ ප්‍රදානය | 350,000,000 | 218,160,000 |
| | 350,000,000 | 218,160,000 |

3.1) බලපත්‍ර ගාස්තුවලට හිලව් වශයෙන් රජයෙන් රු. මිලියන 350ක ප්‍රදානයක් ලැබුණි.

## සටහන 4

බෙදාහැරීමේ පිරිවැය

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014- අනුමත |
|---|---|---|---|---|
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 1,313,059 | 3,452,297 | | 3,452,297 |
| ගුවන් කාලය විකිණීමෙන් කොමිස් මුදල් | 55,605,185 | 55,657,241 | 12,000 | 55,645,241 |
| (දේශීය) | 733,480 | 2,062,577 | | 2,062,577 |
| ගුවන් කාලය විකිණීමෙන් කොමිස් මුදල් | 3,775,144 | 2,541,373 | | 2,541,373 |
| (විදේශීය) | 12,382,769 | 11,249,291 | (6,115,497) | 17,364,788 |
| බොල් සහ අඩමාන ණය සදහා ප්‍රතිපාදන<br>වැඩසටහන ( ක්‍රිකට් සහ කලා ශිල්පීන්) | **73,809,637** | **74,962,779** | **(6,103,497)** | **81,066,276** |

## සටහන 5

අනෙකුත් මෙහෙයුම් පිරිවැය

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014- අනුමත |
|---|---|---|---|---|
| බාහිර ගුවන්විදුලි සංවිධාන සඳහා දායකත්වය<br>පුවත් සේවා සහ පුවත් සාරාංශ<br>වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණය<br>විදුලිය සහ බලශක්තිය<br>තැපැල් ගාස්තු, විදුලි පණිවුඩ සහ දුරකථන<br>මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය<br>රථ වාහන ධාවන වියදම්<br>විකාශන උපකරණ අළුත්වැඩියා සහ නඩත්තු<br>සංගීත භාණ්ඩ අළුත්වැඩියා සහ නඩත්තු<br>ලීබඩු සහ සවිකිරීම් අළුත්වැඩියා සහ නඩත්තු<br>ගොඩනැගිලි සහ උද්‍යාන අළුත්වැඩියා සහ නඩත්තු<br>ක්ෂයවීම<br>ත්‍රිකුණාමලය ක්ෂයවීම<br>ත්‍රකුණාමලය වියදම්<br>බදුකරණය(ආර්ථික සේවා ගාස්තු)<br>ශ්‍රාවක සමීක්ෂණය සහ වෙළෙඳපොළ පර්යේෂණය<br>වාහන කුලියට ගැනීමේ ගාස්තු<br>මුද්දර ගාස්තු<br>ගුවන්විදුලි සංඛ්‍යාන ගාස්තු | 714,622<br>1,121,260<br>727,186<br>13,027,437<br>12,826,646<br>3,445,171<br>15,468,658<br>406,319<br>-<br>9,413,072<br>4,740,838<br>43,621,211<br>182,364,130<br>88,143,179<br>1,807,365<br>-<br>284,140<br>108,421<br>15,000,000 | 1,,069,410<br>1,114,865<br>583,665<br>16,987,410<br>11,298,514<br>5,261,523<br>13,684,531<br>2,051,812<br>56,100<br>8,347,386<br>3,610,881<br>49,979,022<br>181,562,083<br>89,393,115<br>1,567,826<br>(650)<br>6,203,846<br>134,303<br>15,000,000 | (1,364,875)<br><br><br>(3,008,495)<br><br><br><br>232,573<br><br>92,943<br><br>(26,308)<br>3,031,039<br><br>(4,705,472)<br>(14,250)<br><br><br> | 2,434,285<br>1,114,865<br>583,665<br>19,995,905<br>11,298,514<br>5,261,523<br>13,684,531<br>1,819,239<br>56,100<br>8,254,443<br>3,610,881<br>50,005,060<br>178,531,044<br>89,393,115<br>6,273,298<br>13,600<br>6,203,846<br>134,303<br>15,000,000 |
| | **393,219,653** | **407,905,643** | **5,762,574** | **413,668,217** |

## සටහන 06

පරිපාලන පිරිවැය

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014- අනුමත |
|---|---|---|---|---|
| දීමනා- සංස්ථාවේ සභාපති සහ අ.ම. සාමාජිකයන් | 800,,000 | 2,069,200 | | 2,069,200 |
| වැටුප්, වේතන සහ දීමනා | 185,115,252 | 158,625,985 | | 158,625,985 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය | 24,130,194 | 26,316,412 | | 26,316,412 |
| සේවක භාරකාර අරමුදලට දායකත්වය | 4,810,786 | 7,172,723 | | 7,172,723 |
| කාර්යමණ්ඩලය සඳහා අතිකාල | 21,818,873 | 19,244,178 | | 19,244,178 |
| සහන කාර්යමණ්ඩලය | 14,754,425 | 19,202,221 | | 19,202,221 |
| කොන්ත්‍රාත් කාර්යමණ්ඩලය සඳහා වේතන | 17,520,166 | 29,505,949 | | 29,505,949 |
| කාර්යමණ්ඩල පුහුණු ගාස්තු (දේශීය) | - | 42,500 | | 42,500 |
| ගමන් සහ යැපුම් (දේශීය සහ විදේශීය) | 1,806,463 | 1,669,304 | | 1,669,304 |
| නිවාඩු දින වැටුප් | 2,624,761 | 2,490,725 | | 2,490,725 |
| පාරිතෝෂික | 23,335,178 | 44,218,603 | | 44,218,603 |
| සභාපති විසින් සංග්‍රහ | 392,416 | 730,702 | | 730,702 |
| අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංග්‍රහ | 100,380 | 233,567 | | 233,567 |
| සුබසාධනය | 1,035,829 | 1,277,041 | | 1,277,041 |
| වෛද්‍ය සේවා | 189,686 | 157,890 | | 157,890 |
| සාමාන්‍ය ගාස්තු | 1,901,027 | 1,705,107 | | 1,705,107 |
| කුලී ගාස්තු සහ බදු | 7,544,056 | 7,035,380 | | 7,035,380 |
| රක්ෂණ | 2,311,495 | 2,428,299 | | 2,428,299 |
| විගණන ගාස්තු | 600,000 | 550,000 | | 550,000 |
| නෛතික ගාස්තු | 1,551,475 | 2,039,208 | | 2,039,208 |
| ප්‍රකාශන සහ වාර සඟරා | 477,845 | 455,222 | | 455,222 |
| පාරිතෝෂිකය, උසාවි ගාස්තු ආදිය සඳහා දඩ | 862,602 | 1,218,609 | | 1,218,609 |
| | **313,682,908** | **328,388,825** | **-** | **328,388,825** |

6.1) 2015 වසරේදී කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ඥාතීන්ගේ මරණ දැන්වීම් ප්‍රචාරය කිරීම වෙනුවෙන් සංස්ථාව රු. 846,545.94 ක වියදමක් දැරීය. මෙම දැන්වීම් ප්‍රචාරය කරනු ලැබූයේ බලාත්මක දැනට පවතින යෝජනා ක්‍රමය යටතේය. මෙය සෑම වසරකම සංස්ථාව අනුගමනය කළ ක්‍රියාදාමයයි.

පවතින නඩු

ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව තුනකි. ඉන් එක් නඩුවක තත්වය පහත දැක්වෙන පරිදිය. එය දිස්ත්‍රික් උසාවියේ පැමිණිළිකරුවකු වෙනුවෙන් නඩු ගාස්තු සමග රු. 10,000.000 ප්‍රදානය කරන ලෙස දිස්ත්‍රික් උසාවි නඩු අංක 23089/MR තීන්දුව ඉවත දමන ලෙස අයැදීමකි.

පළාත්බද මහාධිකරණයේ නඩු පහක් විභාග වෙමින් පවතී. දිස්ත්‍රික් අධිකරණායේ නඩු දෙකක් වීභාග වෙමින් පවතින අතර ඉන් නඩු දෙකක තත්වය පහත දැක්වෙන් පරිදිය.ඉන් එක් නඩුවකින් පොලිය සමග රු මිලියන 8 ක් ඉල්ලා සිටින අතර අනෙක් නඩුවෙන් පොලිය සමග රු/ 5,917,275 ක් සහ ඇ.ඩො. 26775 කින් 10% ක් කොමිස් මුදලක් ඉල්ලා සිටියි. .

මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පහක් ද කම්කරු දෙපාර්තමේන්තු බේරුම්කරණයේ නඩු දෙකක් ද විභාග වෙමින් පවතී

## සටහන 07

මූල්‍ය වියදම

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014- අනුමත |
|---|---|---|---|---|
| බැංකු ගාස්තු | 480,945 | 490,217 | | 490,217 |
| අයිරා පොළී | 4,461,314 | 5,683,109 | | 5,683,109 |
| විනිමය මත ලාභ/(අලාභ) | 176,576 | 180,864 | 10,292 | 170,572 |
| ණයවර කාඩ්පත් කොමිස් | 49,562 | 48,521 | | 48,521 |
| මුදල් | 1,045,145 | 2,490,894 | | 2,490,894 |
| කල්බදු පොළිය | 6,213,541 | 8,893,605 | 10,292 | 8,883,313 |

## සටහන 08

8(i) ආදායම් බදු

| | 2015 | 2016 |
|---|---|---|
| ගිණුම් අනුව ශුද්ධ ලාභය/ අලාභය | **(287,725,712)** | **(253,950,680)** |
| **එකතුකළා** | | |
| **ආදායම් බදු අඩුකළ නොහැකි** | | |
| **වියදම්** | 43,621,211 | 49,979,022 |
| ක්ෂයවීම | 182,364,130 | 181,562,083 |
| ක්ෂයවීම ත්‍රිකුණාමලය | 3,775,144 | 2,541,373 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 23,335,178 | 44,218,603 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 492,796 | 964,269 |
| සංග්‍රහ | 1,807,365 | 1,567,826 |
| ආර්ථික සේවා ගාස්තු | **255,395,823** | **280,833,176** |
| | 132,192,315 | 126,177,289 |
| **අඩුකළා** | 9,092,168 | 16,266,392 |
| ආදායම් බදු අඩුකළ හැකි වියදම් | 6,668,767 | 10,104,537 |
| ප්‍රාග්ධන දීමනාව | 350,000,000 | 218,160,000 |

| | | |
|---|---|---|
| කල්බදු කුලී | **497,953,250** | **370,708,218** |
| පාරිතෝෂික ගෙවීම | | |
| රජයේ ප්‍රදානය | | |
| | (530,283,139) | **(343,825,721)** |
| | (2,925,291,412) | (2,799,625.691)) |
| බදු අයකළ හැකි ලාභය/අලාභය | **(3,455,574,551)** | **(3,143,451,412)** |
| ඉදිරියට ගෙනා බදු අලාභ | | |
| ඉදිරියට රැගෙන ගිය මුළු බදු අලාභ | | |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය | | |

ආදායමෙන් ව්‍යුත්පන්න වන ලාභය මත 28% ක අනුපාතයකට ආදායම් බදු සඳහා සංස්ථාව යටත් වේ. සංස්ථාවේ ගලපන ලද බදු අයකළ හැකි ලාභ හේතු කොට ගෙන ආදායම් බදු සැලකිල්ලට ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදනයක් සලසා ඇත.

**ii**. විලම්බිත බදුකරණය ශ්‍රී.ල.ගි.ප්‍ර.12 ප්‍රකාරව විලම්බිත බදුකරණය පිළිගැනීම ගණනය කර සලකා බලයි.

### විලම්බිත බදු වත්කම් සහ බැරකම්

| | 2015 | 2014 |
|---|---|---|
| **මූල්‍ය තත්වය** | | |
| විලම්බිත බදු බැරකම් | 75,733,399 | 85,864,191 |
| විලම්බිත බදු වත්කම් | (409,678) | (945,105) |
| ශුද්ධ විලම්බිත බදු වත්කම් | 76,143,077 | 84,919,086 |
| **විස්තීරණ ආදායම් ප්‍රකාශය** | | |
| විලම්බිත බදු බැරකම් | 10,130,792 | 20,216,510 |
| විලම්බිත බදු වත්කම් | (1,354,783) | 194,253 |
| ශුද්ධ විලම්බිත ආදායම් බදු ආදායම/ (වියදම්) | 8,776,009 | (20,410,763) |

**සටහන 9**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දේපල, පිරියත හා උපකරණ

| දළ ධාරණ මුදල පිරිවැයට | 01.01.2015 දිනට ශේෂය රු: | එකතුකිරීම්/ පැවරුම් රු: | බැහැර කිරීම් පැවරුම් රු: | 31.12.2015 දිනට ශේෂය රු: | ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2015.01.01 රු: | කාලසීමාව සඳහා ගාස්තු රු: | බැහැර කිරීම/ පැවරුම රු: | ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2015.12.31 රු: | 2015.12.31 දිනට ශු.පො.ව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම | 7,764,234 | | | 7,764,234 | | | | | 7,764,234 |
| ගොඩනැගිලි | 168,153,640 | 630,340 | | 168,923,977 | 115,700,574 | 3,829,565 | | 119,530,139 | 49,393,838 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 594,220,928 | 551,832 | | 594,772,760 | 477,286,391 | 4,801,777 | | 482,088,168 | 112,684,592 |
| සංගීත භාණ්ඩ | 6,859,440 | 381,750 | | 7,241,190 | 6,685,778 | 68,092 | | 6,753,870 | 487,320 |
| මෝටර් රථ වාහන | 35,326,129 | 12,890,000 | 5,445,300 | 42,770,829 | 60,446,626 | 3,914,049 | 166,342 | 64,194,333 | 12,321,353 |
| මූල්‍ය කල් බදු -රථ වාහන | 33,744,857 | | | 33,744,857 | | - | | | |
| ලී බඩු , සවිකිරීම් | 131,899,640 | 325,017 | 25,267 | 131,199,390 | 107,686,827 | 3,851,468 | | 111,538,295 | 20,661,095 |
| තැටි හා පටි | 24,924,554 | 195 | | 24,924,749 | 24,649,395 | 130,722 | | 24,780,117 | 144,633 |
| ශ්‍රව්‍ය සංඛ්‍යානය | 880,077,488 | 1,300,545 | 277,736 | 881,100,296 | 726,472,007 | 8,782,363 | 26,038 | 735,228,332 | 145,871,963 |
| සම්ප්‍රේශක | 1,410,610,705 | 3,137,664 | | 1,413,748,369 | 960,781,012 | 17,099,516 | | 977,880,528 | 435,867,811 |
| පරිගණක උපකරණ | 35,056,456 | 1,737,980 | 132,943 | 36,661,492 | 32,762,709 | 1,143,659 | 20,687 | 33,885,681 | 2,775,611 |
| පුස්තකාල පොත් | 447,760 | 14,582 | | 462,342 | | - | | | 462,342 |
| සුළු ආයුධ | 107,675 | - | | 107,675 | 103,570 | 0 | | 103,570 | 4,105 |
| | 3,329,333,504 | 20,969,905 | 5,881,246 | 3,344,422,163 | 2,512,574,889 | 43,621,211 | 213,066 | 2,555,983,033 | 788,439,130 |

## දේපල. පිරියත හා උපකරණ

| දළ ධාරණ මුදල පිරිවැයට | 01.01.2015 ට ශේෂය රු: | එකතුකිරීම්/පැවරුම් රු: | බැහැර කිරීම් පැවරුම් රු: | 31.12.2015 දිනට ශේෂය රු: | ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2015.01.01 රු: | කාලසීමාව සඳහා ගාස්තු රු: | බැහැර කිරීම/ පැවරුම රු: | ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2015.12.31 රු: | 2015.12.31 දිනට ශුව.පො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරියත හා | 203,231,757 | | | 203,231,757 | 45,727,145 | 15,242,382 | | 60,969,527 | 142,262,229.88 |
| යන්ත්‍රෝපකරණ | 4,344,000 | | | 4,344,000 | 3,258,001 | 1,085,999 | | 4,344,300 | - |
| මෝටර් රථ වාහන | 3,228,585 | | | 3,228,585 | 726,432 | 242,143 | | 968,575 | 2,260,009.52 |
| ලී බඩු , සවිකිරීම් | 8,848,274 | | | 8,848,274 | 2,654,482 | 884,826 | | 3,539,310 | 5,308,964.39 |
| කාර්යාල උපකරණ | 234,689,948 | | | 234,689,948 | 52,804,174 | 17,601,747 | | 70,405,921 | 164,284,027.37 |
| විදුලි උත්පාදක | 57,280,268 | 2,971,884 | | 60,252,153 | 12,888,060 | 4,426,040 | | 17,314,100 | 42,938,052.39 |
| ශ්‍රව්‍ය සංඛ්‍යානය | 1,675,041,153 | 10,255,476 | | 1,685,296,629 | 374,758,672 | 125,912,811 | | 500,,671,483 | 1,184,625,145.39 |
| සම්ප්‍රේශක | 73,612,786 | | 12,124,157 | 61,488,629 | 73,612,786 | | 12,124,157 | 61,488,629 | - |
| පරිගණක උපකරණ | 5,266,693 | | | 5,266,693 | 1,185,006 | 395,002 | | 1,580,008 | .3,686,,685.07 |
| | 180,561,849 | | | 180,561,849 | 40,343,099 | 13,542,138 | | 53,885,237 | 126,676,611.79 |
| සුළු ආයුධ උපකරණ | **2,446,105,316** | **13,227,360** | 12,124,157- | **2,447,208,516** | **607,957,857** | **179,333,090** | | **775,166,790** | **1,672,041,725.79** |

## සටහන 10

නොනිමි ප්‍රාග්ධන වැඩ

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| ගිණුම්කරණ මෘදුකාංගය<br>කෝපායි සම්ප්‍රේෂකය සහ සම්ප්‍රේෂණ<br>මධ්‍යස්ථානය<br>නව ගොඩනැගිලි සංකීර්ණය<br>කරගහතැන්න ව්‍යාපෘතිය<br>යටියන්තොට ව්‍යාපෘතිය | 584,178<br>4,800,652<br>150,000,000<br>99,186.681 | 1,167,555<br>7,648,693<br>130,000,000<br>2,796,441<br>567,785 |
| | 254,571,510 | 142,180,474 |

## සටහන 11

ආයෝජන

| ක්ෂයවීම | 2015 | 2014 |
|---|---|---|
| ලංකාපුවත් සමාගමේ ආයෝජන | 1,000,000 | 1,000,000 |

## සටහන 12

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014-අනුමත |
|---|---|---|---|---|
| ණයගැති ගුවන් කාලය<br>අඩුකළා: මූල්‍ය වත්කම් හානි<br>කාර්යමණ්ඩල සඳහා ණය<br>කාර්යමණ්ඩලය සඳහා අනෙකුත් අත්තිකාරම්<br>කාර්යමණ්ඩල ණය ගැතියෝ<br>සේ.අ.අ.<br>පූර්ව ගෙවීම්<br>සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් ගෙවීම<br>විවිධ ණය ගැතියෝ<br>අගරු චෙක්පත්<br>P.M.G ජංගම ගිණුම-අවමංගල්‍ය දැන්වීම්<br>ලක්හඩ ශාඛා ගිණුම්<br>G.S.T. පාලන ගිණුම<br>ලැබිය යුතු ආදායම (වෙනත්)<br>රඳවා ගැනීමේ බද්ද (ආදායම)<br>P.M.G ජංගම ගිණුමගුවන්විදුලි බලපත්‍ර ගාස්තු<br>අවිනිශ්චිත ගිණුම<br>අවිනිශ්චිත ගිණුම(සරෆ්)<br>විලම්භිත ආදායම<br>අනෙකුත් තැන්පතු | 185,588,450<br>(103,958,617)<br>7,014,067<br>8,052,588<br>316,917<br>22,008<br>8,253,223<br>22,127,730<br>3,306,373<br>7,997,854<br>12,807,862<br>237,267<br>31,255,572<br>32,876,217<br>195,700<br>221,965<br>281,110<br>-<br>9,264,962 | 198,606,985<br>(100,183,473)<br>6,745,921<br>8,653,983<br>319,973<br>0<br>2,793,558<br>23,198,752<br>3,906,340<br>7,997,854<br>12,807,862<br>237,267<br>10,446,469<br>32,861,470<br>195,700<br>221,965<br>281,110<br>5,102,000<br>9,264,962 | 1,246,812<br>124,258<br><br>(454,000)<br><br><br><br>3,125,709<br>(15,000)<br><br><br><br>2,583,860 | 197,360,736<br>(100,307,731)<br>6,745,921<br>9,107,983<br>319,973<br>-<br>2,793,558<br>20,073,043<br>3,921,340<br>7,997,854<br>12,807,862<br>237,267<br>7,862,609<br>32,861,470<br>195,700<br>221,965<br>281,110<br>5,102,000<br>9,264,962 |
| | 225,841,248 | 223,458,698 | 6,611,076 | 216,847,622 |

## සටහන 13

මාර්ගස්ථ භාණ්ඩ

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014-අනුමත |
|---|---|---|---|---|
| මාර්ගස්ථ භාණ්ඩ | 4,852,069 | 5,294,505 | (207,306) | 5,501,811 |
| එකතුව | 4,852,069 | 5,294,505 | (207,306) | 5,501,811 |

## සටහන 14

මුදල් හා මුදලට සමාන දෑ

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| ලංකා බැංකුව- මාතර<br>මහජන බැංකුව ජාත්‍යන්තර අංශය<br>ලංකා බැංකුව- ටොරින්ටන් - ප්‍රධාන ගිණුම<br>ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා<br>ලංකා බැංකුව-අනුරාධපුර<br>ලංකා බැංකුව- මහනුවර<br>නේෂන්ස් ට්‍රස්ට් බැංකුව<br>ලංකා බැංකුව- ටොරින්ටන් - ගුවන්විදුලි<br>බලපත්‍ර ගිණුම<br>ලංකා බැංකුව- ටොරින්ටන් - එෆ්.එම්.<br>ව්‍යාපෘතිය<br>මුදල් අග්‍රිමය<br>ලංකා බැංකුව- ටොරින්ටන් - කැසට් අලෙවිය<br>ලංකා බැංකුව- මදුරාසිය<br>මුදල් පොත -ත්‍රිකුණාමල ව්‍යාපෘතිය<br>ලංකා බැංකුව - ඉතුරුම්<br>ස්ථාවර තැන්පතු<br>සැනසුම<br>ගිණුම් ආන්තිකය (මහජන බැංකුව) | 7,726<br>233,087<br>17,020,694<br>377,104<br>12,510<br>153,815<br>11,597,272<br>6,737,471<br>1,429,088<br>132,760<br>5,895,640<br>1,093,081<br>18,255,485<br>191,505<br>88,986<br>90,666,817<br>322,147<br>106,636,263 | 61,150<br>194,498<br>(48,087,342)<br>377,104<br>(16,020)<br>982,282<br>6,840,698<br>9,415,910<br>1,626,410<br>205,530<br>10,581,799<br>980,886<br>11,080,809<br><br>85,502<br>20,133,672<br>322,147<br>86,308,377 |
| | **260,851,452** | **101,096,412** |

## සටහන 15

රඳවාගත් ඉපැයුම්

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| ආදායම් සංචිතය ජනවාරි 01 | (248,365,120) | (219,291,349) |
| ආදායම් සංචිතය ගැලපුම | 45,168,281 | 33,356,642 |
| **ආදායම් සංචිතය** | 71,050,297 | (56,201,442) |
| ආදායම් සංචිතය ගැලපුම 2014 | (41,966,329) | (6,228,972) |
| එකතුව | (174,112,871) | (248,365,120) |

**සටහන 16**

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014- අනුමත |
|---|---|---|---|---|
| ණයහිමියාගේ ගුවන් කාලය<br>විකිණීම<br>ආපසු ගෙවනු ලබන විවිධ තැන්පතු<br>උපචිත වියදම්<br>සේ.අ.අ.<br>ලබා නොගත් වැටුප් සහ වේතන<br>විවිධ ණයහිමියෝ<br>විවිධ ණයහිමියෝ<br>ආරක්ෂක තැන්පතුව<br>සැනසුම- සුනාමි<br>ජර්මන් ගුවන්විදුලිය<br>කල්බදු ගිණුම<br>ණය හිමි පාලන ගිණුම<br>රජරට සංචාරක බංගලාව | 18,047,401<br>9,794,054<br>208,858,288<br>3,584,749<br>-<br>14,789,451<br>10,000<br>630,472<br>322,147<br>16,932,095<br>4,709,287<br>114,400<br>175,536 | 23,590,565<br>9,604,054<br>202,235,289<br>3,863,076<br>0<br>20,411,022<br>10,000<br>892,957<br>322,147<br>16,932,095<br>8,262,080<br>0<br>280,124 | 15,817953<br>(398,675)<br>(44,274,727)<br><br>(487,477)<br>229,696<br><br>(2,414)<br><br><br>215,058 | 7,772,612<br>10,002,729<br>246,510,016<br>3,863,076<br>487,477<br>20,181,326<br>10,000<br>895,371<br>322,147<br>16,932,095<br>8,047,022<br><br>270,096 |
| | 277,967,880 | 286,403,409 | (28,890,553) | 315,293,967 |

**සටහන 17**

මූල්‍ය නොවන බැරකම්

| විස්තරය | 2015 | 2014 ගලපන ලද | ගැලපීම් | 2014- අනුමත |
|---|---|---|---|---|
| ජා.ආ.බ.<br>ජාතිය බේරාගැනීමේ අරමුදල<br>ආදායක බද්ද<br>රදවාගැනීමේ බද්ද<br>වැට් පාලන ගිණුම<br>ආ.සේ.ගා.<br>ජා.ගො. බද්ද<br>ජාතික ආරක්ෂක අරමුදල<br>ආදායම් බද්ද සඳහා ප්‍රතිපාදනය<br>දේ.ආ.බ. දෙ.ට ගෙවිය යුතු ආදායම් බදු | 15,007,806<br>(12,418)<br>147,661<br>-<br>20,478,861<br>53,176,337<br>48,976,562<br>2,835<br>692,759<br>50 | 15,007,806<br>(12,418)<br>(192,098)<br>(32,861,470)<br>34,237,030<br>58,041,334<br>40,402,845<br>2,835<br>692,759 | <br><br>(163,840)<br><br>(170,847)<br>(6,672362)<br>7,368 | 15,007,806<br>(12,418)<br>(192,098)<br>133,967<br>34,237,030<br>58,041,334<br>40,402,845<br>2,835<br>692,759 |
| | 138,470,454 | 141,642,059 | (6,672,001) | 148,314,060 |

## සටහන 18

මූල්‍ය කල්බදු

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| මූල්‍ය කල්බදු (මෝටර් රථ) | 13,977,801 | 30,244,193 |
| | 13,977,801 | 30,244,193 |
| කල්බදු කුලී | (9,092,168) | (16,266,392) |
| | 4,885,633 | 13,977,801 |
| අඩුකළා | | |
| කල්බදු පොළී අවිනිශ්චිත | (176,345) | (1,221,490) |
| ගිණුම | 4,709,288 | 12,756,311 |
| | 4,709,288 | 8,047,022 |
| | | 4,709,288 |
| ජංගම බැරකම | | |
| ජංගම නොවන බැරකම | | |

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එම්ආර්ඩී/ඒ/එස්එල්බීසී/1/15/379    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 30 දින

සභාපති,

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අභිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 හි 11 හා 12 ඡේද ප්‍රකාරව ගුවන් විදුලි සේවාවන් සඳහා ස්වයංක්‍රිය පහසුකම් ලබාගැනිමට ඉකුත් වර්ෂවලදී වැය කළ රු.3,400,000 ක මුදල අස්පෘශ්‍ය වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට පරිගණක උපාංග යටතේ ගිණුම්ගත කර ක්ෂය ප්‍රතිපාදනයක් ද ඇතිකර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගුවන් කාල විකුණුම් ණයගැති ශේෂවලට අදාල එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම් ණයගැති ගිණුමින් අත්හැරී තිබීම හේතුවෙන් එකතුකළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ගිණුම් හා ණයගැති ගිණුම් පිළිවෙලින් රු.22,911,452 ක්, රු.2,033,946 ක් හා රු.24,945,398 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල අතර ගනුදෙනු සටහන් කරනු ලබන ජංගම ගිණුම් සැසදුම් කර, ගිණුම්වලට ගැලපීම් සිදුනොකර, ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම්වල සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.6,046,009ක බැර ශේෂය වර්ෂ අවසානයේ ගුවන් කාල විකුණුම් ණයහිමියන්ට එකතු කර දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ ලෝක කුසලාන ක්‍රිකට් ප්‍රචාරක අයිතිය ලබාගැනීමේ පුරස්කාරය (Royalty ) සඳහා ඉකුත් වර්ෂයේදී ගෙවූ රු. 16,854,787 ක මුදල ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට එම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එය නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 5,605,497 ක් පමණක් ගැලපීම් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම රු.11,249,290 කින් අඩුවී තිබුණි.

(ඈ) කුලීපිට ගිවිසුම් යටතේ ලබාගෙන තිබූ වටිනාකම රු.5,977,000 ක් වූ මෝටර් රථයක ගිවිසුම් කාලය 2015 පෙබරවාරි මාසයේදී අවසන් වී තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළදී එහි වටිනාකම කුලීපිට මෝටර් රථ ගිණුමෙන් මෝටර්රථ ගිණුමට මාරු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ ස්ථිර සේවකයින්ට ගෙවූ රු.12,697,500 ක ප්‍රසාද දීමනාව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනම අයිතමයක් යටතේ අනාවරණය නොකර වැටුප්, වේතන හා දීමනා ගිණුම යටතේ ඇතුළත් කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

අහරු වෙක්පත්, සේවක ණය, සේවක විවිධ අත්තිකාරම් සහ විවිධ තැන්පතු සඳහා වූ උපලේඛනවලට එකතුව රු.14,726,349 ක් වූ හඳුනා නොගත් ශේෂයන් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්ට සමාන කර තිබුණි.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

වසර 21 කට පෙර හා 2007 වර්ෂයේදී හඳුනාගත් එකතුව රු.503,075 ක මුදල් වංචාවක් සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන්ගෙන් මුදල් අයකර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිත ගිණුම යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියේ දැක්වෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | 2010 ට පෙර ගෙවිය යුතු තැන්පතු | 8,496,419 | තැන්පතු දිනය හා තැන්පතුකරුගේ නම ඇතුළත් උපලේඛන |
| (ආ) | ණයගැතියන් (මරණ දැන්වීම් සඳහා තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල) | 7,997,854 | ලිඛිත ශේෂ සනාථ කිරීමක් |
| (ඇ) | ලැබිය යුතු තැන්පතු | 561,272 | තැන්පත් කරන ලද දිනය, තැන්පතුවට හේතුව, තැන්පත් කළ ස්ථානය හා වටිනාකම දැක්වෙන උපලේඛන හෝ ලේඛනය |
| (ඇ) | කෙරීගෙන යන වැඩ සඳහා ගෙවීම් | 150,000,000 | ඉන්වොයිසි, ලදුපත්, අපේක්ෂිත වැඩ සැලැසුම, වියදම් ඇස්තමේන්තු, ගෙවීම් අනුමත කිරීමේ ලියවිලි |
| (ඉ) | හඳුනා නොගත් මිලදී ගැනීම් අත්තිකාරම් (සේවක) | 7,684,737 | අත්තිකාරම් ලබාගත් නිලධාරීන්ගේ නාමලේඛනය සහ ලබාගත් මුදල |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගෙවීම් | 5,684,567 | ගෙවීම් වවුචර් 68 ක් |
| (උ) | වසර 10 කට අධික කාලයක සිට ගිණුම්වල පවතින වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ (ලක්හඩ ශාඛා ගිණුම) | 12,807,802 | ලිපි ගොනු හා ශේෂ සනාථ කිරීම් |
| (ඌ) | ජර්නල් සටහන් 05 ක් මගින් ගිණුම් ගැලපීම් | 136,847,515 | වියදම් සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය හා විදේශීය ගුවන් කාල විකුණුම් ණයගැති ශේෂ එකතුව රු.188,894,823 ක් වූ අතර, මුළු ණයගැති ශේෂයන්ගෙන් රු.67,513,771 ක ශේෂ වර්ෂ 10 ට වඩා පැරණි ණය ශේෂ විය.

(ආ) කෙටිකාලීන විකාශන වැඩසටහන් ප්‍රචාරය කිරීමට පෙර මුදල් අය නොකිරීම හේතුවෙන්,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.9,280,593 ක මුදලක් ලැබිය යුතුව තිබුණි. සංස්ථාවේ ඉඩ දෙන සාමාන්‍ය ණය කාල සීමාව මාස 02 ක් වුවත් ඉහත ණය ශේෂය තුළ වසර 10 ට වැඩි රු.835,611 ක් ද වසර 5 ත් වසර 10 ත් අතර රු.5,313,172 ක් ද වසර 1 ත් වසර 5 ත් අතර රු. 3,131,810 ක ශේෂයක්ද විය.

(ඇ) 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා එකතුව රු.1,677,600 ක විගණන ගාස්තු පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මාස 03 සිට වසර 1 1/2 ඉක්මවා තිබුණු රු.6,528,780 ක සැපයුම් අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි.

(ඉ) සේවාදායකයෙකු සමඟ ඇතිකර ගත් සේවා ගිවිසුමෙහි අයවිය යුතු මුදල නිවැරදිව සටහන් නොකිරීම නිසා අයකර ගත නොහැකි රු.631,200 ක ශේෂයක් ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙන් හා ස්වාධීන රූපවාහිනී සේවයෙන් ලැබිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.2,400,000 ක් හා රු.1,500,000 ක් වුවද, එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් විදුලි සංස්ථාවට ගෙවිය යුතු වටිනාකම් පිළිවෙලින් රු.3,324,086 ක් හා රු.548,734 ක් විය. තවද, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ගිණුම් අනුව ගුවන් විදුලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.1,990,119 ක් වුවද ගුවන් විදුලි සංස්ථාවේ ගිණුම් අනුව රූපවාහිනී සංස්ථාවට ගෙවිය යුතු මුදලක් පෙන්නුම් නොකෙරුණි.

(උ) ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු රු.208,858,288 ක උපචිත වියදම් තුළ වසර 02 ත් 10 ත් අතර වූ රු.11,970,861ක් ඇතුළත්ව පවතින අතර, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගුවන් විදුලි සම්ප්‍රේෂණ කුලුනු බදු දීමේ ගිවිසුම්වලට අනුව බදුකරුවන් 16 දෙනෙකුගෙන් රු.1,600,000 ක තැන්පත් මුදලක් අයකරගත යුතුව තිබුණද, එම මුදල් අයකර නොතිබුණි.

(එ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ජාතිය ගොඩනැගීමේ බද්ද ලෙස සේවාදායකයින්ගෙන් අයකර ගත් රු.48,976,562 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර මූල්‍යමය නොවන වගකීම් ලෙස ජංගම වගකීම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඒ) ජංගම වත්කම් සහ ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල 2001 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා නොවෙනස්ව දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පවතින එකතු වටිනාකම රු.14,455,573 ක හර හා රු.32,274,883 ක බැර ගිණුම් ශේෂ 13 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නිරවුල් කිරීමට කටයුත කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය - VII පරිච්ඡේදයේ 10.1 වගන්තිය | නිලධාරියෙකු සිය කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම තුළින් සහ වැටුප් වර්ධක උපයාගත යුතු කාල පරිච්ඡේදය තුළ මුළුමනින්ම සේවය කිරීමෙන් පමණක් වැටුප් වර්ධක උපයා ගත යුතු වුවත්, ඊට පටහැනිව වැටුප් වර්ධක දිනය නොසලකා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2015 මැයි 25 දින සිට නිලධාරීන් 30 දෙනෙකුට පමණක් වැටුප් වර්ධක 03 බැගින් ලබාදී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(1) (අ) | සමාලෝචිත වර්ෂය තුළදී වාහන 09 ක් හදිසි අනතුරුවලට ලක්ව තිබුණ ද ඒවා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 101 හා 110 | 2011 වර්ෂයේදී බාහිර ප්‍රචාරක අංශයෙහි සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව හානිවූ සහ අස්ථානගත වූ ලෙස හඳුනාගෙන තිබූ වර්ග 21කට අයත් අයිතම 77ක් සම්බන්ධයෙන් වටිනාකම හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | සේවකයින්ට ලබාදුන් අත්තිකාරම් රු.774,617 ක් අදාළ කාර්යය නිමවී මාස 02 සිට වර්ෂ 04 දක්වා කාලයක් ප්‍රමාද වී නිරවුල් කළ අවස්ථා 38 ක් නිරීක්ෂණය විය. |

(iv) මුදල් රෙගුලාසි 381(1) — භාණ්ඩාගාර අනුමැතියකින් තොරව දේශීය බැංකු ගිණුම් 14 ක් සහ විදේශීය බැංකු ගිණුම් 02 ක් ආරම්භ කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට එම ගිණුම්වල එකතුව රු.170,051,875 ක ශේෂයක් පැවතුණි.

(v) මුදල් රෙගුලාසි 396 (ඇ) — සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත්කර මාස 06 ට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.168,354ක් වටිනා චෙක්පත් 62 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(vi) මුදල් රෙගුලාසි 757 — ත්‍රිකුණාමල (ඩොයිෂ්වෙල්) ප්‍රතිචිකාශනාගාරයේ රු.2,447,208,516 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ සිදුකොට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

---------------------------

(i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ

8.2.2 ඡේදය — මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළදී රු.58,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

9.4 ඡේදය — ආයතනයේ සේවකයන් 05 දෙනෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශ සේවය සඳහා මුදාහැර ඒ වෙනුවෙන් සේවකයන් 04 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,584,671 ක් ගෙවා තිබුණි.

| | | |
|---|---|---|
| | (ii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 2/2015 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | ජංගම දුරකථන මිලදී ගැනීමේ පිරිවැය අදාළ නිලධාරියා විසින් දැරිය යුතු අතර අදාළ ආයතනය විසින් ප්‍රතිපූරණය නොකළ යුතුය. එසේ වුවද සංස්ථාව විසින් නිලධාරීන්ට ජංගම දුරකථන 24 ක් ලබාදීම සඳහා 2012 ඔක්තෝබර් සිට 2016 මැයි දක්වා රු. 522,249 ක් වැයකර තිබුණි. |
| | (iii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 චක්‍රලේඛයේ 3.1 හා 3.2 ඡේදය | සංස්ථාවේ නිල වාහන පහසුකම් සපයා තිබූ නිලධාරීන් සිව්දෙනෙකු සඳහා ඔවුන්ට හිමි ඉන්ධන ලීටර් ප්‍රමාණය ඉක්මවා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව ඩීසල් ලීටර් 9,904 ක් වෙනුවෙන් රු.1,180,672 ක් වැය කර තිබුණි. |
| (ඇ) | 2005 ජූනි 16 දිනැති අංක අමප/05/විවිධ (026) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | උපදේශකවරුන් පත්කිරීම සඳහා ඉල්ලීම් කිරීමේදී නම් කරනු ලබන්නාගේ ජීවදත්ත තොරතුරු සමඟ ඔහුට පැවරීමට නියමිත කාර්යභාරය හා කාලවකවානුව සහිතව සංදේශයක් ඉදිරිපත් කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත් 2014 හා 2015 වර්ෂවලදී අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව උපදේශකවරු 04 දෙනෙකු බඳවාගෙන එකතුව රු.1,670,000 ක දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 1:1:6 (v) ඡේදය | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව සංස්ථාවේ විධායක නිලධාරීන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.270,000 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,050,297 ක ලාභයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.56,201,442 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.127,251,739 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ වෙනත් මෙහෙයුම් ආදායම රු.51,244,708 කින් හා රාජ්‍ය ප්‍රදාන රු.131,840,000 කින් වැඩිවීම හා පරිපාලන වියදම් හා අනෙකුත් මෙහෙයුම් වියදම් රු.29,391,907 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ ශුද්ධ ලාභයක් ඇති වී තිබුණ ද 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශුද්ධ අලාභයක් ඇති වී තිබූ අතර, නැවතත් සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ලාභයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.489,806,207 ක් වූ දායකත්වය 2013 වර්ෂය වන විට රු.458,031,460 ක් දක්වා අඩුවී තිබුණ ද, ඉන් පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.834,004,819 ක් වී තිබුණි.

### 3.2 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා එංගලන්ත ක්‍රිකට් තරඟාවලියේ ප්‍රචාරක අයිතිය සංස්ථාව විසින් විධිමත්ව ලබාගැනීමට කටයුතු නොකර ක්‍රිකට් ප්‍රචාරයේදී වෙළඳ දැන්වීම් ලබා ගැනීමට ප්‍රචාරක කටයුතු කිරීම නිසා විධිමත් ලෙස ප්‍රචාරක අයිතිය ලබාගත් ආයතනය රු.මිලියන 50 ක වන්දි මුදලක් ඉල්ලා නඩුවක් පවරා තිබුණි. ඒ සඳහා සංස්ථාව විසින් රු.833,500 ක නීතිඥ ගාස්තු ගෙවා තිබුණි.

(ආ) සංස්ථා වාහනයක ගමන් කිරීමේදී සිදු වූ හානියක් සම්බන්ධයෙන් රු.මිලියන 08 ක වන්දියක් ඉල්ලමින් සංස්ථා සේවකයෙකු විසින් දිසා අධිකරණයක නඩුවක් පවරා තිබුණි. ඒ සඳහා සංස්ථාව සමාලෝචිත වර්ෂයේදී නීතිඥ ගාස්තු රු.158,250 ක් ගෙවා තිබුණි.

(ඇ) අලෙවි විධායක නිලධාරියෙකු විසින් සිදු කළ රු.මිලියන 13.21 ක වංචාවකින් ගිණුම් පොත් හා ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන නොතිබීම නිසා රු.මිලියන 5.65 ක් පමණක් අයකර ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබුණි. ඉතිරි රු.මිලියන 7.56 ක මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කොළඹ වාණිජ මහා අධිකරණයේද නඩු පවරා තිබුණි.

(ඈ) ආයතනයේ සේවකයින් 30 දෙනෙකුට පමණක් වැටුප් වර්ධක 03 බැගින් ලබාදීම නිසා සංස්ථාවේ අනෙකුත් සේවකයන් විසින් සංස්ථාවට එරෙහිව පැවරූ නඩුවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 410,000 ක නීතිඥ ගාස්තු ගෙවා තිබුණි.

(ඉ) සංස්ථාව විසින් අසත්‍ය ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළ බව පවසමින් එයට විරුද්ධව කොළඹ දිසා අධිකරණයේ පැවරූ නඩුවකට රු.මිලියන 10 ක වන්දියක් ගෙවීමට සංස්ථාවට නියම වී තිබූ අතර, එයට විරුද්ධව සංස්ථාව කළ අභියාචනයෙන් පසුව කොළඹ සිවිල් අභියාචනාධිකරණයෙන්ද එම තීන්දුවම ලැබී තිබීම නිසා සංස්ථාව නැවත මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1966 අංක 37 දරන ශ්‍රවන් විදුලි සංස්ථා පනත අනුව සංස්ථාවේ අරමුණු පහත සඳහන් වේ.

(i) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුන සඳහා වැඩිම ශ්‍රාවක පිරිසක් සහිත ශ්‍රවන් විදුලි නාලිකා පවත්වාගෙන යන ආයතනය ලෙස කටයුතු කිරීම.

(ii) වගකීමෙන් යුතුව සමබර තොරතුරු කඩිනමින් ලබාදෙන, ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීම.

(iii) දේශීය සංස්කෘතියේ අභිවෘද්ධිය පිණිස උසස් සහ නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම.

(iv) දැනුම, ආකල්ප සහ කුසලතාවන්ගෙන් පිරිපුන් ස්වයං අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීම.

(v) නිෂ්පාදන සහ විකාශන තාක්ෂණය නිසි පරිදි යාවත්කාලීන කරමින් දෙස් විදෙස් ශ්‍රාවකයන්ට පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම.

(vi) ආචාරධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන් විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම උදෙසා පුරෝගාමී ආයතනය ලෙස ක්‍රියා කිරීම.

(vii) ජාතික ගුවන් විදුලිය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා නිර්මාණශීලී දායකත්වය සැපයීම.

(viii) යහපත් මූල්‍ය පාලනයක් හා මානව සම්පත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම.

(ix) තරඟකාරී වෙළඳපොළ උපායශීලීව ජය ගැනීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංස්ථාවේ ගුවන් විදුලි සේවාවන් ස්වයංක්‍රීයකරණය කිරීමේ කටයුතු ආරම්භ කළ 2008 වර්ෂයේ සිට 2012 මැයි 14 දක්වා ඒ වෙනුවෙන් රු.3,400,000 ක මුදලක් වැය කර තිබුණ ද, 2016 ජූලි මාසය වන විටද මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අංශ 03 ක් යටතේ වූ ක්‍රියාකාරකම් 13 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් නුවරඑළිය නිවාඩු නිකේතනය බදු දීමෙන් 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි දක්වා ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු රු.7,210,000 ක බදුකුලී හා බදු ගැණුම්කරුගෙන් නිවාඩු නිකේතනය නැවත පවරා ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට වැය කළ රු.2,151,206 ක නඩු ගාස්තුව බදු කරුගෙන් අයකර ගැනීමට සංස්ථාව විසින් 2016 ජූනි 30 දක්වාම ක්‍රියා කර නොතිබුණි.

(ආ) නුවරඑළිය, හාවා එළිය ග්‍රාම සේවා වසමෙහි රූඩ් 01 පර්චස් 20 ක භූමි ප්‍රදේශයක පිහිටි නිවහන නිවාඩු නිකේතන ගොඩනැගිල්ලෙහි අයිතිය පමණක්, රු.250,000 ක් ගෙවා 1979 වර්ෂයේදී සංස්ථාව මිලදී ගෙන තිබුණි. නුවරඑළිය අතිරේක දිසාපති හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ 1987 ජනවාරි 08 දිනැති ලිපියට අනුව අවුරුද්දකට රු.6,000 බැගින් 1985, 1986 හා 1987 වර්ෂයන් සඳහා බදු මුදල් ගෙවා අදාල ඉඩමෙහි බදු අයිතිය ලබාගැනීමට දන්වා තිබුණ ද, ඉඩමෙහි බදු අයිතිය 2016 ජූනි 30 දක්වාම ලබාගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු රු.462,342 ක පුස්තකාල පොත් පැවතුණද ඒවා අනාරක්ෂිත ලෙස ගබඩා කර තිබීම නිසා මීයන් හා වේයන් විසින් විනාශ කරමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2005 පෙබරවාරි 27 දින සිට වසා දමා ඇති මහඉලුප්පල්ලම විකාශනාගාරයේ භූමිය,ගොඩනැගිල්ල හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ කිසිදු ඵලදායී කටයුත්තකට යොදා නොගෙන විනාශ වෙමින් පැවතීමට ඉඩ හැර තිබුණු බව අනාවරණය වූ අතර, මුරකරුගේ වැටුප, දුරකථන හා විදුලි බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 513,418 ක් වැය කර තිබුණි.

(ඇ) 2013 අප්‍රේල් 09 දින සිට වසා දමා ඇති කොත්මලේ ප්‍රජා ගුවන් විදුලි සේවාවෙන් සංස්ථාවට කිසිදු ආදායමක් නොලැබුණද, සමාලෝචිත වර්ෂය තුළදී සේවකයන් තිදෙනෙකුගේ වැටුප්, දුරකථන හා විදුලි වියදම් සඳහා එකතුව රු. 1,658,818 ක් වැයකර තිබුණි.මෙසේ නිෂ්කාර්ය වියදම් දැරීම සංස්ථාවේ අලාභය වැඩිවීමට හේතුවීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සංස්ථාවේ පවත්නා ප්‍රධාන ජංගම ගිණුමේ 2015 නොවැම්බර් මාසය දක්වා පැවති බැංකු අයිරාව සඳහා රු.4,461,314 ක අයිරා පොලී ගෙවා තිබුණි.

(ඉ) 2015 මාර්තු මාසයේ සිට අළුත්වැඩියාවන් සිදු කිරීම සඳහා අඹේවෙල නිවාඩු නිකේතනය තාවකාලිකව වසා දමා තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළදී සේවක වැටුප්, දුරකථන හා විදුලිය සඳහා රු.1,312,743 ක වියදම් දරා තිබුණි. 2016 ජූලි 04 විගණන දින වන විටත් මෙම නිවාඩු නිකේතනයේ අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකර ප්‍රයෝජනයට ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඊ) ත්‍රිකුණාමල ප්‍රතිවිකාශනාගාරයේ ට්‍රාන්ස්මීටර්, ඇන්ටනාවලට අදාළව පවතින අමතර කොටස්වල (Spare Parts) වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කර නොතිබූ අතර, ඉන්වෙන්ට්‍රි ලේඛනයක් හෝ පැවරුම් ලේඛනයක් සහ භාරගත් භාණ්ඩ පිළිබඳ උපලේඛනයක් ද නොතිබුණි.

(උ) විකුණුම් ඉන්වොයිසිය වෙනුවට ප්‍රචාරක උපලේඛන පදනම් කරගෙන විකුණුම් ගිණුම් තැබීම සිදුකර තිබුණි. විගණනයේදී නිරීක්ෂණය වූ පරිදි ගුවන් කාල විකුණුම් උපලේඛන සකස් කිරීමේ අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.489,088,683 ක ගුවන් කාල විකුණුම් ආදායමෙහි නිවැරදිතාවය විගණනයේදී සනාථ කරගත නොහැකි විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

සංස්ථාව විසින් භුක්ති විඳිනු ලබන අඹේවෙල පිහිටි ඉඩමේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත් කොටස සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍රයක් ලබාගැනීමට අනුමැතිය ලැබී තිබියදී, එම කටයුතු අවසන් නොකර තෙවන පාර්ශවයක් වෙත ලිඛිත ගිවිසුමක් නොමැතිව බදු දීම නිසා සංස්ථාවට මෙම ඉඩමෙහි භුක්තිය නොලැබී යාමට මෙන්ම නීතිමය ගැටළුවලට මුහුණ පෑමටද සිදු වී තිබුණි.

## 4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

සංස්ථාව සතු රු. 23,400,170 ක් වටිනා වාහන 14 ක් හා වටිනාකම විගණනයට අනාවරණය නොවූ වාහනයක්ද නිෂ්ක්‍රියව පැවති අතර, තවත් වාහන 05 ක් ඌන උපයෝජිතව පැවතුණි. නිෂ්ක්‍රියව පැවති මයික්‍රෝ වර්ගයේ වෑන් රථ 05 ක් මිලදී ගෙන වර්ෂ 03 කටත් අඩු කාලයකදී ධාවන කටයුතු වලින් ඉවත්කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වාහන සඳහා කල්බදු ගෙවමින් පැවතුණි.

**4.6** හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්‍රාම ගිය සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික අඩුවෙන් ගෙවා තිබීම නිසා කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝග මත සමාලෝචිත වර්ෂයේදී රු.861,926 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබූ අතර, ආර්ථික සේවා ගාස්තු නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම නිසා 2004/2005 තක්සේරු වර්ෂයේ සිට 2013/2014 දක්වා හිඟ බදු මත රු.11,979,867 ක අධිභාරයක් පනවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී සේවාදායකයෙකු සමඟ ගිවිසුමකට එළඹීමේදී අයවිය යුතු මුදල අඩුවෙන් දක්වා තිබීම නිසා සංස්ථාවට රු. 673,200ක පාඩුවක් සිදුවී තිබුණි.

**4.7** ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට ගැළපෙන ස්ථාවර සම්බන්ධ කිරීම් පද්ධතියක් (linking system) ලබා ගැනීම හෝ පුද්ගලික ආයතනයකින් තාක්ෂණික සහාය ලබාගැනීම යන අවස්ථා දෙකෙන් වඩා වාසිදායක අවස්ථාව පිළිබඳව සොයා බැලීමකින් තොරව 2012 වර්ෂයේදී ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන සඳහා වැඩසටහන් සම්බන්ධ කිරීමට මූලිකව රු.15,000,000 ක් හා මාසිකව රු.400,000 ක් බැගින් බදු මුදලකට යටත්ව පෞද්ගලික ආයතනයකින් තාක්ෂණික සහාය ලබාගෙන තිබුණි. මෙම සැපයුම්කරු තෝරා ගැනීම අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් සිදුකළ යුතු බව දැනුම් දී තිබියදී එයට පටහැනිව සංස්ථාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.29,588,488 ක් ගෙවා තිබුණි.

(ආ) සංස්ථාව සතු කරගහතැන්න විකාශනාගාරය නවීකරණය කිරීමට රු. 104,720,555 ක් වටිනා 10 KW ට්‍රාන්ස්මිටර් 07 ක් හා ඇන්ටනා පද්ධතියක් මිලදීගෙන සවිකිරීමේ කොන්ත්‍රාත්තුව පැවරීමේදී පහත සඳහන් අඩුපාඩු සහිතව කටයුතු කර තිබුණි.

(i) විකාශනාගාරය සඳහා උපයෝගී කරගත හැකි උපරිම ට්‍රාන්ස්මිටර් බලය, උචිත කුමන වර්ගයේ ට්‍රාන්ස්මිටර්ද (air cool/liquid cool) හා වැයවන විදුලි බලය ආදී කරුණු පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.

(ii) යටියන්තොට විකාශනාගාරයට උපකරණ මිලදී ගැනීමේ කාර්යය අඩුපාඩු සහිතව සිදුකළ නිලධාරීන්ම මෙම කාර්යයෙහිදී ද තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කර තිබුණි.

(iii) ලංසුකරුවන්ට සමාන අයිතියක් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(iv) භාණ්ඩ ඇණවුම් කිරීමට පෙර සිදුකළ යුතු විදුලි සංදේශන නියාමන කොමිසමේ හා ආනයන අපනයන පාලකගේ අනුමැතිය ලබාගැනීම, භාණ්ඩ රේගුවට ලැබීමෙන් පසුව සිදුකිරීම නිසා රු.781,516 ක ප්‍රමාද දඩයක් ගෙවීමට සිදුවී තිබුණි.

(v) කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය සති 15 කින් නිමකළ යුතු වුවද ඒ සඳහා සති 66 ක කාලයක් ගතවී තිබූ අතර, ප්‍රමාද කාලය සඳහා දඩ මුදලක් අයකර ගැනීමට හෝ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi) මෙම උපකරණ සවිකිරීමෙන් පසුව සාර්ථකව ක්‍රියාත්මක වන බව සනාථ කිරීම සඳහා අවශ්‍ය වන ඉංජිනේරු සහතිකය හා ට්‍රාන්ස්මීටර් අවශ්‍ය තිව්‍රතාවයෙන් යුක්ත බවට ඉදිරිපත් කළ යුතු ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා 2016 ජූනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.මෙම අඩුපාඩු හේතුවෙන් ගෙවිය යුතු සියයට 20 ක අවසන් ගෙවීම සිදුකර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී ද මූලධන වැය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු. මිලියන 77.5 ක මුදලින් රු. මිලියන 40 ක් අයහාර වියදම් සඳහා යොදවාගෙන තිබුණි.

(ඈ) පුත්තූර්හි ඇන්ටනා කුලුන ඉදිකිරීමේ කටයුතු, ඉදිකිරීමේ මූල්‍ය හා තාක්ෂණික හැකියාව නොසලකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව 2011 ජූනි 16 දින හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා තිබුණි. ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස හස්තකර්මාන්ත මණ්ඩලය වෙත රු.9,126,933 ක් ගෙවා තිබූ අතර, ඉදිකිරීම් කටයුතු සිදු කිරීමෙන් තොරව කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි. ගෙවූ අත්තිකාම් මුදලින් රු.4,348,041 ක් පමණක් සංස්ථාවට ආපසු ගෙවීම නිසා රු.4,778,892 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 30 ට අනුව බඳවාගැනීමේ හා උසස්වීමේ පරිපාටි සකස්කර අනුමැතිය සඳහා අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට එවන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2010 සැප්තැම්බර් 15 දින දන්වා තිබුණද, 2016 ජූනි 30 දින වන විටත් අමාත්‍යාංශ ලේකම් වෙත බඳවාගැනීමේ පරිපාටි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීමෙන් තොරව සේවකයින් බඳවා නොගත යුතු බව දන්වා තිබියදී ඊට පටහැනිව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් සහ පැවරුම් පදනම මත පිළිවෙලින් සේවකයන් 69 ක් හා 04 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) නියමිත බඳවාගැනීමේ පරිපාටිය අනුගමනය කර 2004 ජූලි 01 දින අධ්‍යක්ෂ (සංගීත) තනතුරට බඳවාගත් නිලධාරියාට, අධ්‍යක්ෂ තනතුරක් නොමැති කැසට්පට් විකුණුම් අංශය භාරදී තිබුණු අතර, අධ්‍යක්ෂ (සංගීත) තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකළ හා එම අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් නොමැති පාලක තනතුර දැරූ නිළධාරියකු 2009 අප්‍රේල් 24 දින සිට එම තනතුරේ වැඩ බැලීමට පත්කර තිබුණි.

(ඈ) ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 867 ක් සහ අතිරික්ත කාර්ය මණ්ඩලය 323 ක් වෙනුවෙන් රු.483,680,556 ක වැටුප් හා වේතනද කොන්ත්‍රාත් පදනම මත නියුක්ත නිලධාරීන් ,සහන කාර්ය මණ්ඩලය හා පැවරුම් පදනම මත බඳවාගත් සේවකයින්ට රු.42,421,916 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ස්ථිර කාර්ය මණ්ඩලය අතිරික්තව සිටියදී සහන කාර්ය මණ්ඩලයේ සේවය, පැවරුම් පදනම මත සහ කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගැනීම ගැටළු සහගත විය.

(ඉ) සංස්ථාවේ ප්‍රධාන මාණ්ඩලික තනතුරු 03ක් වූ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්), (ඉංජිනේරු) හා (පාලන) යන තනතුරු වර්ෂ 03ත් 08ත් අතර කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

(ඊ) සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරමින් සිටි නිලධාරියා 2015 ජනවාරි 19 දින සිට එම තනතුරෙන් මුදාහැර තිබුණද, ගුවන්විදුලි සංස්ථා පනතේ 19(3)(ආ) වගන්තිය ප්‍රකාරව එම නිලධාරියා පෙර සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි පිහිටුවා නොතිබුණි. ඒ වෙනුවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව 2015 ඔක්තෝබර් 19 දින සිට සංස්ථාවේ උපදේශක තනතුරක පිහිටුවා තිබූ නමුත්, ඔහු විසින් එම තනතුර භාර නොගන්නා බව දැනුම් දී තිබුණි. මෙම නිලධාරියාව මුදාහරින ලද දිනයේ සිට රාජකාරි පැවරීමක් සිදුකර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ දී වැටුප් හා දීමනා, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායක ලෙස එකතුව රු.986,529 ක් ගෙවා තිබුණි. ඊට අමතරව නිල වාහනයක් හා ඉන්ධන ද සංස්ථාව සපයා තිබුණි.

**4.9 වාහන උපයෝජනය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව කුලී පදනම මත වාහන කිසිවක් සංස්ථාව ලබාගෙන නොමැති බව දන්වා තිබුණ ද, අවසන් ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයයේදී කුලී පදනම මත ලබාගත් වාහන වෙනුවෙන් රු.4,272,104 ක කුලී ගාස්තු ගෙවා තිබුණි. මෙම ගෙවීම් තුළ පසුගිය වර්ෂය වෙනුවෙන් ගෙවූ රු.489,800 ක් ද ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවති වාහන 03 කට එකතුව රු.214,565 ක අළුත්වැඩියා වියදම් දරා තිබුණ ද, එම වාහන ධාවන තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 25 දිනදීය.

## 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව 2015-2017 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශය විසින් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විගණන විමසුම් 97 ක් නිකුත් කර තිබුණද, කළමනාකරණය විසින් 2016 ජූනි 30 දින වන විට එම විමසුම්වලින් 37 කට පමණක් පිළිතුරු ලබාදී තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 04ක් පැවතියද, 2015 දෙසැම්බර් 31 දිනට විගණන සහායකයන් දෙදෙනකු පමණක් සේවයේ යොදවා තිබුණි.

## 5.4 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පමණක් එය සකස් කර තිබූ අතර, එහි ද අවශ්‍ය තොරතුරු ඇතුළත් කර නොතිබුණි. තවද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද සකස්කර නොතිබුණි.

**5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2016 ජූනි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.7 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේදී මීටර් 60 ක් හා මීටර් 100 ක් උස ඇන්ටනා කුලුනු 2ක් ගෙන්වීම සඳහා රු.23,119,683 ක් වැයකර තිබුණු අතර, කුලුනු සවිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකට අත්තිකාරම් ලෙස රු.2,568,000 ක් ගෙවා තිබුණි. සවිකළ යුතු ස්ථාන තීරණය කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කුලුනු සවිකර නොතිබූ අතර, ඒකල භූමියේ අනාරක්ෂිතව ගොඩගසා තිබුණු බව අනාවරණය විය.

(ආ) 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කොන්ත්‍රාත් 32 ක් මෙහෙයවා තිබුණු අලෙවි විධායක විසින් රු.6,356,853 ක මුදලක් වංචාකර ඇති බව හඳුනාගෙන තිබුණත්, රු.945,000 ක් පමණක් අයකර ගැනීමට පොලීසියෙන් නඩු පවරා තිබුණු අතර, අයවිය යුතු ඉතිරි මුදල අයකර ගැනීම සඳහා 2016 ජූනි 30 දින වනවිටත් නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් රු.860,000 ක් ගෙවා මිලට ගෙන තිබුණු නිවාස දෙකක් (අනුරාධපුර හා මහනුවර) සඳහා පැවරුම් සහතික ලබාගෙන නිසි පරිදි අයිතිය ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව සතු නිල නිවාස 22 කින් නිවාස 03 ක් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් භාවිතා කරනු ලබන අතර, තවත් නිවාස 02ක් සංස්ථාවේ සේවකයින් නොවන පුද්ගලයින් විසින් භාවිතා කරනු ලබන බව විගණනයට නිරීක්ෂණය විය. අනුරාධපුර නගර සීමාවේ පිහිටා තිබූ අධ්‍යක්ෂ බංගලාව ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් අනාරක්ෂිතව පැවතීම නිසා කඩා ඉවත් කිරීමට සිදුවී තිබුණි. තවත් නිවාස 03 ක් භාවිතයෙන් තොරව අනාරක්ෂිතව පැවතුණි

ඊට අමතරව නිල නිවාස කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට ලබාදීමද විධිමත් ක්‍රමවේදයක් යටතේ සිදුකර නොතිබුණි. දැනට නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් හා ඔවුන්ට එම නිවාස ලබාදුන් ආකාරය හා කුලී අයකරනවාද යන්න තහවුරු කිරීමට අවශ්‍ය උපයෝගී ලියවිලි හෝ වාර්තා නඩත්තු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) වත්කම් පාලනය | (i) සංස්ථාවට පවරා ඇති ඉඩම් නිරවුල් කර නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු නොකිරීම.<br>(ii) පුස්තකාල පොත් අනාරක්ෂිතව පැවතීම. |
| (ආ) ණයගැති පාලනය | (i) වර්ෂ 10 කට වඩා පැරණි ණය ශේෂ අයකර ගැනීමට අවධානය යොමු නොකිරීම.<br>(ii) සේවාදායක ගිවිසුම් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කර නොගෙන සේවක අතිරික්තයක් පැවතියදී දිගින් දිගටම බඳවාගැනීම් සිදුකර තිබීම.<br>(ii) උසස්වීම් ලබාදීමේදී නිවැරදි ක්‍රියා පටිපාටියක් අනුගමනය කර නොතිබීම. |

(ඇ) ගිණුම්කරණය

(i) විකුණුම්වල නිවැරදිතාවය ඉන්වොයිස්පත් සමඟ පරීක්ෂා කිරීමක් සිදු නොවීම.

(ii) සංස්ථාවේ ගිණුම්කරණ ක්‍රමය යාවත්කාලීන කර නොතිබීම.

(ඉ) ප්‍රසම්පාදනය

(i) සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබීම.

(ii) විකාශනාගාරයක් නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවක් පැවරීමේදී අඩුපාඩු සහිතව කටයුතු කර තිබීම.

(ඊ) වාහන පාලනය

(i) වාහන අනතුරු සම්බන්ධව පරීක්ෂණ පවත්වා නොතිබීම.

(ii) ධාවන සටහන් හා ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය**

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම යටතේ 1.2 සහ 1.3 ඡේදවල සඳහන් කරුණුවලට එකඟ වෙමි.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

2015 වර්ෂය සඳහා අහිතකර මතයන් ලබාදීමට විගණකාධිපති සලකා බලන ලද කරුණු අතර

අහිතකර මතය ලබාදීමට පාදක කරගෙන ඇති ගිණුම්කරණ දෝෂ පෙර වර්ෂවලට අදාල වන අතර, 2015 වර්ෂය තුළ ගිණුම්කරණ දෝෂ බොහෝ දුරට අඩුකරගෙන ඇත. ගිණුම්කරණ අඩුපාඩු ලෙස පෙන්වා දී ඇති කරුණු පිළිබඳ පැහැදිලි කිරීම් පහත දක්වේ.

## 2:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2:2:1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය

ප්‍රමිත අංක 38 ස්වයංක්‍රීය පහසුකම් යටතේ ලබාගත් උපකරණ පරිගණක උපකරණ බැවින්,

11, 12 ඡේද පරිගණක උපාංගයන් යටතේ ගිණුම්ගත කර ඇත. විගණනය අදහස් කර ඇති පරිදි 2017-09-30 දින එම වත්කම් නැවත අශ්පෘෂ්‍ය වත්කම්වලට මාරු කර ඇත.

### 2:2:2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2016 වර්ෂයේදී ණයගැතියන්ට අදාල එකතුකළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු එකතුරකර ගිණුම් ගලපා ඇත.

(ආ) ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලය අතර ගනුදෙනු සටහන් කරනු ලබන ජංගම ගිණුම්

සඳහා අදාල ගැලපීම් සිදුකර ගිණුම් නිවැරදි කර ඇත.

(ඇ) ලෝක කුසලාන ක්‍රිකට් ප්‍රචාරක අයිතිය ලබාගැනීම සඳහා 2015 වර්ෂයේ ගෙවූ මුදල 2016 ජ.නල් සටහන් මගින් නිවැරදි කර ඇත.

(ඈ) කුලීපිට ගිවිසුම් මත ලබාගත් වාහන කුලී ගිවිසුම් අවසන් වූ බැවින්, ජ.නල් සටහන් මගින් මෝටර් රථ ගිණුමට මාරු කර ඇත.

(ඉ) සංස්ථාවේ නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා ඇත්තේ දිරි දීමනාවක් වන අතර ප්‍රසාද දීමනාවක් නොවේ. පරිපාලන වියදම් යටතේ වන වැටුප් වේතන රු.186,115,252/ හි මෙම වියදම ඇතුලත්ව ඇත.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

අගරු චෙක්පත්, සේවක ණය, සේවක විවිධ අත්තිකාරම් හා විවිධ තැන්පතු යටතේ හඳුනාගත හැකි ශේෂ හඳුනාගෙන 2002 ට පෙර හඳුනාගත නොහැකි ශේෂ අතරින් කොටසක් අවශ්‍ය අනුමතීන් ලබාගෙන ගිණුම් නිවැරදි කර ඇත.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

අවිනිශ්චිත ගිණුම් විමර්ශනය කර වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන ගැලපීම් කර ඇත.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) 2010 ට පෙර ගෙවිය යුතු තැන්පතු - මෙම ගිණුම නිවැරදි කර ඇත.

(ආ) ප්‍රාදේශීය තැපැල් කාර්යාල වෙනුවෙන් අයවිය යුතුව තිබූ මෙම මුදල් වර්ෂ 15 කට වඩා පැරණි වන අතර, අදාල තැපැල් කාර්යාලය හඳුනාගැනීමට ලිපිලේඛන කිසිවක් නොතිබූ බැවින්, පෝස්ට් මාස්ටර් ජනරාල්ගෙන්ද තහවුරුවක් ලබාගත නොහැක. එමනිසා අයකර ගැනීමේ හැකියාවක්ද නැත. වගකිවයුතු පාර්ශවයන්ද තීරණය කරගත නොහැකි බැවින්, අදාල අනුමතීන් ලබාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඇ) ලැබිය යුතු තැන්පත් සම්බන්ධ උපලේඛනය පිළියෙල කර ඇත.

(ඈ) කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ පෙන්වා ඇත්තේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවූ මුදලය. එම වියදම්වලට අදාල ඉන්වොයිස්, ඇස්තමේන්තු සහ සියලුම සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය භාරයේ ඇත. මෙම විස්තර ලබාදෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා ඇත. මෙම මුදලට අදාළ විස්තර නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන වත්කම් ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ඇත.

(ඉ) උපයෝගි පොත් අනුව අත්තිකාරම් පියවීම් නිසි පරිදි සටහන් වී තිබූ අතර, එම පියවීම් පිළිබඳ ජ.නල් සටහන ප්‍රධාන ලෙජරයට ඇතුලත් නොකිරීම නිසා 2002 වර්ෂයට පෙර සිට හඳුනාගත නොහැකිව තිබූ මෙම ශේෂය පිළිබඳ විශේෂ වාර්තාවක් 2017-01-27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලද අතර 2017-03-21 දින පැවති සංස්ථා මණ්ඩලයේ අංක 04:02 තීරණය අනුව මෙම හඳුනා නොගත් ශේෂ පෙර වර්ෂවලට ගැලපීම් කර ඇත.

(ඊ) විගණනයට ඉදිරිපත් කිරීමට ප්‍රමාදවී තිබුණේ වැටුප් ගෙවීමට අදාල වව්චර් සහ ප්‍රාදේශීය කාර්යාල වව්චර් වේ. පසුව ඉදිරිපත් කර ඇත.

(උ) ලක්හඬ ගුවන්විදුලිය, ගුවන්විදුලි සංස්ථාව යටතේ ගුවන්විදුලි පරිශ්‍රය තුළම පවත්වාගෙන ගොස් තිබූ අතර, පසුව එය අයි. ටී. එන්. ආයතනයට පවරාගෙන ඇත. සංස්ථා පරිශ්‍රය තුළ පවත්වාගෙන යන ලද කාලයට අදාලව ලබාදෙන ලද පහසුකම් සඳහා අයවිය යුතු ලෙසට ගණනය කරන ලද මුදල මෙම ගිණුම යටතේ සටහන් කර ඇත. මෙම කරුණ සනාථ කර ගැනීම සඳහා දෙපාර්ශවය අතර එකඟතා ගිවිසුමක් නැත.

(ඌ) ජ.නල් සටහන් මගින් කරන ලද ගැලපීම් සඳහා එම ගැලපීම් කිරීමට හේතු වූ කරුණු සහ යොමුගත ලිපිලේඛන පිළිබඳ විස්තර ජ.නල් සටහන්වල නිශ්චිතව දක්වා ඇත.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙම ඡේදයේ සඳහන් පරිදි එකතුව රු. මිලියන 188.8 නිවැරදිය. එම මුදලින් රුපියල් මිලියන 67.5 වසර 10 වඩා පැරණි ඒවා වේ. එම මුදලින් වැඩි ප්‍රමාණයක් විදේශීය ආයතන වසා දැමීම හෝ වෙනත් හේතූන් මත ගනුදෙනු නතර කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන එම නිර්දේශ මත මෙම තොරතුරු භාණ්ඩාගාරයට යොමුකර ඇත.

(ආ) මෙම ඡේදය යටතේ පෙන්වා දී ඇති ණයවලින් කොටසක් සහන කාලය ඉක්මවා ඇති ණය බව පිළිග න්නා අතර, දැනට හිඟ ණය අයකර ගැනීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර ඇත.

(ඇ) සංස්ථාවේ මූල්‍යමය තත්ත්වය අනුව විගණන ගාස්තු කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කරමි.

(ඈ) සැපයුම් අත්තිකාරම්වලින් මංගල ගුණරත්න මහතා නමින් ඇති රු. 6000/- හැර ඉතිරි මුදල 2016 වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත.

(ඉ) සේවා ගිවිසුම අනුව ප්‍රචාරය කරන වාරයකට අය කරන මුදල සහ සම්පූර්ණ වැඩසටහන වෙනුවෙන් අය කරන මුදල සේවා ගිවිසුමේ පැහැදිලිව අතුලත් නොකිරීම නිසා සේවාදායකයා ගාස්තු පිලිබඳ වැරදි ලෙස අවබෝධ කිරීම මත මෙම වරද සිදුවී ඇත.

(ඊ) ගුවන්විදුලි සංස්ථාවේ ගිණුම් අනුව රූපවාහිනී සංස්ථාවෙන් ලැබිය යුතු මුදල නිරවුල් කර ඇත.

(උ) ජංගම වගකීම් යටතේ උපචිත වියදම් ලෙස විගණන ගාස්තු, විදුලි සංදේශ නියාමන කොමිසමට ගෙවිය යුතු බදු මුදල් සහ වෙනත් උපචිත වියදම් ඇතුලත්ව ඇත. සංස්ථාවේ මූල්‍ය තත්ත්වය අනුව මෙම උපචිත වියදම් ඊලග මුදල් වර්ෂය තුළ ගෙවීමට නොහැකි වී ඇත.

(ඌ) විදුලි සම්ප්‍රේෂණ කුළුණු බදු දුන් බදුකරුවන් 16 අතරින් 12දෙනෙකුගෙන් තැන්පත් මුදල අයකරගෙන ඇති අතර, ඉතිරි බදු තැන්පතු අයකර ගැනීමට කටයුතු කරමින් ඇත.

(එ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු මුදල් කොටස් වශයෙන් ගෙවීම් කිරීමට අනුමතිය ලබාගෙන ගෙවීම් කරනු ලැබේ.

(ඒ) ජංගම වත්කම් හා ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශවල පෙන්වා ඇති අය නොවන වෙළඳ ණයගැතියන් පවතින බව පිළිගන්නා අතර, ජංගම බැරකම් යටතේ ද උපචිත වියදම් ඇතුලත් වී ඇති අතර එයද කොටස් වශයෙන් ගෙවීම් කිරීමට කටයුතු කරමි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

අ, ආ ඡේද මගින් පෙන්වා ඇති (i) සිට (vi) දක්වා අනුඡේදවල සඳහන් කරුණු සම්බන්ධයෙන් පෙන්වා ඇති අයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල ඡේද අනුව ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන ලෙස අදාල අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇත.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

(ඈ) සංස්ථාවේ සේවා අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ඇතිව ඒ ඒ ක්ෂේත්‍රවල විශේෂ දැනුම ඇති අය උපදේශකවරුන් ලෙස කෙටි කාලීනව බඳවාගෙන ඇති අතර, එම සේවය තවදුරටත් අවශ්‍ය යැයි හැඟීයන අවස්ථාවලදී නැවත අධ්‍යක්ෂ මණ්ඩල අනුමතියෙන් සේවාකාලය දීර්ඝ කර ඇත.

(ඉ) සංස්ථාවේ සේවා අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව ඉන්ධන දීමනා ගෙවනු ලැබේ.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනය විසින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රතිඵල යටතේ සඳහන් දත්ත සහ තොරතුරු නිවැරදිය.

### 3.2 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) ශ්‍රී ලංකා එංගලන්ත ක්‍රිකට් තරඟාවලිය 2014 ගුවන්විදුලි විකාශනය සම්බන්ධ එම්.ජී.එම්.ආර්.නෙට්වර්ක්ස් ආයතනය නඩු පවරා ඇත. මෙම නඩුව සඳහා සමථයක් යෝජනා කර ඇති අතර, රුපියල් මිලියන 50ක වන්දි මුදලක් සංස්ථාවෙන් ඉල්ලා ඇත.

(ආ) සංස්ථා වාහනයක ගමන් කිරීමේදී හදිසි අනතුරක් සිදුවීමෙන් සිදුවූ ශාරීරික හා මානසික හානිය සඳහා වන්දි මුදලක් ඉල්ලා උපාලි ධර්මසිරි යාපා නඩු පවරා ඇත. මෙම නඩුව විභාග වෙමින් පවතින අතර, රුපියල් මිලියන 08ක වන්දි මුදලක් හා එදින සිට පොලිය ඉල්ලා ඇත.

(ඇ) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව විසින් අලෙවි විධායක එම්. එන්. එම්. අසාම්ගෙන් සංස්ථාවට

අයවිය යුතු රු. 7,551,750.29 ක මුදල අයකර ගැනීමට පළාත්බඳ මහාඅධිකරණයේ නඩු පවරා ඇති අතර, රු. 4,716,812.76 ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත.

(ඈ) සංස්ථා සේවකයින් 57 දෙනෙකුට උසස්වීම් සහ වැටුප් වර්ධක ලබාදීමට එරෙහිව සංස්ථා සේවකයන් 07දෙනෙකු සහ සංස්ථා වෘත්තිය සමිති 4ක් විසින් නඩු පවරා ඇත. නඩුව විභාග වෙමින් පවතී.

(ඉ) ආර්. ඒ. සී. ගුණතිලක විසින් කොළඹ දිසා අධිකරණයේ පවරන ලද අංක 23089/එම්ආර් නඩුවේ නියෝගයට එරෙහිව සංස්ථාව විසින් කොළඹ සිවිල් අභියාචනාධිකරණයට අභියාචනා කළ අතර, එකී නඩු අංක 231/2004 නඩුවේ නියෝගය එරෙහිව සංස්ථාව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කරන ලදී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අරමුණු ලෙස කාර්ය සාධනය යටතේ අංක 08 සිට 10 දක්වා පෙන්වා ඇති කරුණු නිවැරදිය. එම ඡේදයේ (අ) යටතේ සඳහන් පරිදි ගුවන්විදුලි සේවාවන් ස්වයංක්‍රීයකරණය කිරීමේ ක්‍රමය යටතේ දැනට සේවාවන් 03ක් ස්වයංක්‍රීයකරණය කර ඇත. මේ සඳහා රුපියල් මිලියන 3.4 වියදම් කර ඇත.

(ආ) ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් සමහර ක්‍රියාකාරකම් එම වර්ෂයේදී සම්පූර්ණ කරගත නොහැකි වුවද, ඊලග වර්ෂයේදී සම්පූර්ණ කර ඇත.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අ. මෙම මුදල් අයකර ගැනීම සඳහා නිත්‍යානුකූලව කටයුතු කිරීමට නීති අංශය වෙත යොමුකර ඇත.

ආ. නුවරඑළිය නිවාඩු නිකේතනයේ බදු අයිතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් ඇත. මේ වන විට අදාල මැනුම් කටයුතු කර ඉදිරි ක්‍රියාමාර්ග ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කරගෙන යයි. මේ වන විට සංස්ථාව මගින් නිවහන නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන යයි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

අ. වර්තමානය වන විට සංස්ථාවේ විමර්ශන පුස්තකාලය පවතින ඉඩකඩ අනුව පොත්පත් සහ රාක්කවලට ආරක්ෂා සහිතව තැන්පත් කිරීමට කටයුතු කර ඇත.

ආ. මහඉලුප්පල්ලම විකාශනාගාරයේ සියලුම වට්ටෝරු භාණ්ඩ ඉවත් කර ඇති අතර, ගොඩනැගිලි අදාල ආයතනවලට භාරදීම සඳහා කටයුතු කරමින් ඇත.

ඇ. කොත්මලේ ප්‍රජා ගුවන්විදුලිය සඳහා මහවැලි අධිකාරිය විසින් ලබාදී තිබූ ගොඩනැගිලිවල කොත්මලේ සේවය වසා දමා ජනමාධ්‍ය පුහුණු කිරීම් ආයතනයක් පවත්වාගෙන යයි.

ඈ. සංස්ථාව අයිරා පහසුකම් ලබාගැනීම නිසා අයිරා පෙළී ගෙවීමට සිදුවේ.

ඉ. අඹේවෙල නිවාඩු නිකේතනය අලුත්වැඩියා කිරීම සඳහා තාවකාලිකව වසා තිබුණත් එහි සේවය කළ සේවකයන් රාජකාරියෙහි යොදවා තිබුණි. මේ වන විට අලුත්වැඩියා කළ එක් නිවසක් සංචාරකයින් සඳහා විවෘත කර ඇත.

ඊ. ත්‍රිකුණාමල විකාශනාගාරයේ ට්‍රාන්ස්මීටර් ඇන්ටනාවලට අදාලව පවතින අමතර කොටස්වල වටිනාකම පැවරුම් අගය තුළ ඇතුලත්ව ඇත. වට්ටෝරු භාණ්ඩ ලේඛනවලට ද සටහන් කර ඇත.

උ. උපලේඛන මත ගිණුම් තැබීම කරන බව පිළිගනිමි. ප්‍රචාරක උපලේඛන මත පදනම්ව ගිණුම් තැබීමෙන් පසු එම උපලේඛන සකස් කර අලෙවි අංශයට යවා තහවුරු කිරීම කරනු ලැබේ. වෙනස්කම් ඇති අවස්ථාවල අවශ්‍ය ගැලපීම් කර ඇත.

## 4:4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

සංස්ථාව විසින් භුක්ති විඳිනු ලබන අඹේවෙල පිහිටි බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ඉඩම් කොටස පුවත්පත් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර ලිඛිත අවබෝධතා ගිවිසුමකින් එම ඉඩමේ නඩත්තුව සඳහා බදු දෙන ලදී. සංස්ථාව විසින් ඉල්ලුම් කර ඇත්තේ මෙම ඉඩමෙහි සංස්ථාව විසින් සංවර්ධනය කළ කොටසේ අයිතිය පමණි.

## 4:5 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

නිශ්ක්‍රීයව පැවති මයික්‍රෝ වර්ගයේ වෑන්රථ 05 ඩබල් කැබ් රථ 02 හා කාර් රථ 02 ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් 2017 වර්ෂයේදී විකුණන ලදී.

## 4:6 හඳුනාගන්නා ලද පාඩු

අ. කම්කරු නීතියට අනුව පාරිතෝෂික අඩුවෙන් ගෙවීම් නිසා වන්දියක් ගෙවීමට ද, ආදායම් බදු ප්‍රමාද වීම නිසා අධිභාරයක් ගෙවීමට ද සිදුවී ඇත.

ආ. සේවාදායක විසින් ගිවිසුම නිවැරදිව අවබෝධ කර නොගත් නිසා මෙය සිදුවී ඇති අතර, එම මුදල අයකර ගැනීමට අදාල සේවාදායකයා දැනුවත් කර ඇත.

## 4:7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය

(අ) මෙම ඡේදය යටතේ පෙන්වා දී ඇති පරිදි ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන සඳහා වැඩසටහන් සම්බන්ධ කිරීමට ගෙවා ඇති මුදල නිවැරදිය. සංස්ථාවට ගැළපෙන පරිදි ස්ථාවර සම්බන්ධ කිරීම් (Linking) පද්ධතියක් ලබා ගැනීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් හා එය නඩත්තු කිරීම සඳහා යන වියදම් ද අධික බැවින් බාහිර ආයතනයකින් මෙම සේවාව ලබා ගැනීමට සිදුව ඇත. ඒ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලද අතර එහිදී ද තීරණය වූයේ දැනට පුද්ගලික අංශයෙන් ලබා ගන්නා සේවාව වඩා ඵලදායී බවයි.

(ආ) **i.** කරගහතැන්න නවීකරණ කටයුතු සක්‍යතා අධ්‍යයනයක් කර ආරම්භ කර ඇත.

ii. ඉංජිනේරු අංශයට බඳවාගෙන ඇති සුදුසුකම් ලත් නිලධාරීන් හැර වෙනත් නිලධාරීන්

ඉංජිනේරු ව්‍යාපෘති සඳහා යෙදවීමට නොහැක.

iii. ටෙන්ඩර් කරුවන්ට සමාන අයිතියක් ලබාදීමට කටයුතු කර නොතිබුනි යනුවෙන් කර ඇති නිරීක්ෂණය අපහැදිලිය. තවද මෙම ටෙන්ඩර් කටයුතු කර ඇත්තේ ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ය.

iv. විදුලි සංදේශ නියාමන කොමිසමේ සහ ආනයන අපනයන පාලකගේ අනුමතිය ලබාගැනීම ප්‍රමාදවීම නිසා දඩමුදල් ගෙවීමට සිදුවිය.

v. තාක්ෂණික හේතුන් නිසා ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වී ඇත.

vi. 2016 ජූලි 22 වන දින ඔබ විසින් ඉල්ලා ඇති ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා සම්ප්‍රේෂණ යන්ත්‍රවල කාර්යක්ෂමතාව හා ඉංජිනේරු සහතිකය 2016.08.02 දින විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

(ඇ) 2011 වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් කොටසක් අයහාර වියදම් ලෙස මාරු කිරීමට සිදු විය.

(ඈ) මෙම සියලු කටයුතු සංස්ථා මණ්ඩල තීරණ අනුව ක්‍රියාත්මක වු අතර, ක්‍රියාත්මක වීමේදී ලක්සල ආයතනයට ඇතිවූ ගැටළු නිසා ව්‍යාපෘතියේ වැඩ අතරමග නතර කිරීමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කිරීමේදී ලක්සල ආයතනය මූලික කටයුතු සඳහා මුදලින් කොටසක් රඳවාගත් බවත්, ඉතිරි මුදලින් මිලියන 4.3 ක් ආපසු ලබාගෙන ඇත.

## 4:8 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ)බඳවා ගැනීමේ පරිපාටිය සකස් කරමින් පවතී.

(ආ) සේවා අවශ්‍යතාවය මත සංස්ථාවේ කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) අධ්‍යක්ෂ (සංගීත) ලෙස බඳවාගෙන ඇති නිලධාරියා සේවා අවශ්‍යතාවය මත තාවකාලිකව ප්‍රකාශන අංශයට අනුයුක්ත කර ඇත. එවිට සංගීත අංශයේ රාජකාරි කටයුතු පාලක (සංගීත) වෙත පවරා ඇත.

(ඈ) ස්ථිර කාර්ය මණ්ඩලය 867 වුවත් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා යොදවාගත හැකි සේවකයින් එම අතිරික්තය තුළ නැත. එමනිසා සේවා අවශ්‍යතාවය මත අදාල ක්ෂේත්‍ර සඳහා සේවකයින් බඳවා ගැනීම සිදුකර ඇත.

(ඉ) මෙම තනතුරු සඳහා ඉදිරියේදී සුදුසුකම් ලත් නිලධාරීන් පත්කිරීමට නියමිතය.

(ඊ) විගණන නිරීක්ෂණ මගින් පෙන්වා ඇති කරුණු නිවැරදිය. ආයතනික මට්ටමින් විසදාගත නොහැකිවූ ගැටළුවක් මෙ තත්ත්වයට හේතුවී ඇත.

## 4:9 වාහන උපයෝජනය

( අ) ප්‍රාදේශීය විකාශනාගාර 05ක් සඳහා කුලී පදනමට වාහන ලබාගෙන සේවයේ යොදවා ඇත. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මිළ ගණන් කැඳවා සැපයුම් කරුවන් තෝරාගනු ලබයි. මේ සඳහා එකඟතා ගිවිසුම් අත්සන් කරනු ලබයි.

(ආ) ධාවන තත්ත්වයට පත්කිරීමට හැකිවේ යැයි අපේක්ෂාවෙන් එම අලුත්වැඩියා සිදුකළද, ධාවන තත්ත්වයට සුදුසු නොවන බැවින් අමාත්‍යාංශයේ අනුමතිය මත මෙම වාහන ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5:1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ දිනය ලෙස වාර්තාවේ සඳහන් දිනය නිවැරදිය

### 5:2 සංයුක්ත සැලැස්ම

2016 -2018 සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කොට ඇත

### 5:3 අභ්‍යන්තර විගණනය

(අ) අභ්‍යන්තර විගණන විමසුම් සඳහා සියලු පිළිතුරු ඉදිරිපත් කර ඇත.

(ආ) අභ්‍යන්තර විගණන අංශයට විගණන සහායකවරුන් දෙදෙනෙකු පමණක් ඇත.
ඉදිරියේදී කාර්ය මණ්ඩලය සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත.

### 5:4 විගණන කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර වෙනස්වීම මත විගණන කමිටු රැස්වීම් කාර්තු පදනමට පවත්වා ගැනීමට නොහැකිවී ඇත.

### 5:5 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂිකව සකස් කර ඇත.

### 5:6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012, 2013, සභාගත කිරීම සඳහා අදාල කටයුතු කර ඇත. 2014 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත සමග මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

### 5:7 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) ඒකළ විකාශනාගාරයේ ඇති උපකරණ හා බඩුභාණ්ඩ පිළිබඳව පරික්ෂා කර බලා පාවිච්චියට ගතහැකි උපකරණ ප්‍රාදේශීය විකාශනාගාරවලට මාරු කිරීමටත්, අනෙක් උපකරණ සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම සඳහා විශේෂ කමිටු දෙකක් පත්කර ඇත. ඒකළ විකාශනාගාර භූමියේ ඇති කුළුණුවල අමතර කොටස් සම්බන්ධයෙන් මෙම කමිටු යෝජනා අනුව කටයුතු කිරීමට නියමිතය.

(ආ) අධිකරණ කටයුතු සඳහා යොමුකර ඇත.

(ඇ) මහනුවර හා අනුරාධපුර නිවාසවල අයිතිය ලබා ගැනීම සඳහා අදාල කටයුතු කරමින් ඇත.

(ඈ) සංස්ථාව සතුව තිබූ නිල නිවාස අතරින් මධ්‍යම තරංග විකාශනාගාර වසා දැමීම

නිසා පසුගිය යුධ වාතාවරණය තුළ තාවකාලිකව යුධ හමුදාවට පරිහරණයට ලබා දී ඇත. ඉඩම්වල තිබූ නිල නිවාස ඇතුළු ගොඩනැගිලි යුධ හමුදාව විසින් පරිහරණය කරයි. නිල නිවාස කාර්ය මණ්ඩලයේ

නිලධාරීන්ට ලබාදීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර ඇත.

## 6. පද්ධති හා පාලනයන්

### පාලන ක්ෂේත්‍රය

### (අ) වත්කම් පාලනය

i සංස්ථාව භුක්ති විදිමින් ඇති ඉඩම් නිරවුල් කිරීමට කටයුතු කරමින් ඇත.

ii පුස්තකාලය විධිමත් පරිදි සකස් කිරීමට පියවර ගෙන ඇත.

### (ආ) ණයගැතියෝ

i අයනොවී පවතින ණයගැතියන් පිළිබඳ පරික්ෂා කර බලා ඉතාමත් පැරණි සහ අදාල ලිපිගොනු සොයා ගැනීමට නොහැකි ණය සම්බන්ධ වාර්තාවක් භාණ්ඩාගාරයට යොමු කර ඇත.

ii සේවාදායක ගිවිසුම් නිවැරදි ලෙස පිළියෙල කර පවත්වාගෙන යාමට උත්සහ කළද ඇතැම් ඒවායේ අඩුපාඩු ඇත.

### (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය

i සංස්ථාවේ සේවා අවශ්‍යතාවය මත විවිධ අංශ සඳහා සේවකයින් බඳවාගෙන ඇති බව පිළිගනිමි.

ii සේවාකාලය පදනම්ව අංශ ප්‍රධානීන්ගේ නිර්දේශ අනුව උසස්වීම් ලබා දී ඇත.

### (ඈ) ගිණුම් කරණය

i ගුවන්කාල උපලේඛනය මත ගිණුම් සකස් කරයි. උපලේඛන ඉනිවොයිස් අනුව සැසදීම් කර හඳුනාග න්නා වෙනසක්ම් ජ.නල් සටහන් මගින් වෙනස් කරනු ලැබේ.

### (ඉ) ප්‍රසම්පාදනය

i වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී විස්තරාත්මකව පිළියෙල කිරීමට කටයුතු කර ඇත.

ii විකාශනාගාර නවිකරණය කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් කටයුතු කර ඇත. සමහර අවස්ථාවල ප්‍රමාදවීම් සිදුවී ඇත.

### (ඊ) වාහන පාලනය

i වාහන අනතුරු සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කර පොලිස් පරික්ෂණ වාර්තා ද ලබාගෙන අදාල රක්ෂණ වන්දි අයකර ගැනීමට කටයුතු කර ඇත.

ii ධාවන සටහන් හා ලොග් පොත් පිළියෙල කර ඇති අතර, ඒවා යාවත්කාලීන කරමින් පවත්වාගෙන යයි.

Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka